# THE WHITE HACKLE

ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව
இலங்கை காலாட் படை சஞ்சிகை
JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY

84 Issue
April - June




www.army.lk/lightinfantry Search...

editor.whitehackle@gmail.com



ශ්‍රී ලංකා පාබල හමුදා මධ්‍යස්ථාන සේනාවිධායක
**නි/60673 බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්එස්පි**

සුබ මොහොතින්
නව තනතුරට පත් වූ ඔබට
රෙජිමේන්තු අධිපති ඇතුලු
සියලුම නිලයින්ගේ
උණුසුම් සුබ පැතුම්...





අණදෙන නිලධාරි 4 ශ්‍රීලපාහ
නි/62252 ලුතිනන් කර්නල් ජේකේආර්පී ජයසිංහ
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ



අණදෙන නිලධාරි 10 ශ්‍රීලපාහ
නි/63373 මේජර්
ටීකේඩී ධර්මසේන ආර්එස්පී ශ්‍රීලපාහ



අණදෙන නිලධාරි18(සෙව්) ශ්‍රීලපාහ
**නි/4880 මේජර්**
**එච්එම්පීසී හේරත් ශ්‍රීලපාහ**



2 වන අණදෙන නිලධාරි11 ශ්‍රීලපාහ
නි/63175 මේජර්
එච්කේජේයූ ජයරත්න ශ්‍රීලපාහ



2 වන අණදෙන නිලධාරි 10 ශ්‍රීලපාහ
නි/64232 මේජර් කේවීඑක් කරුණාරත්න
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ



2 වන අණදෙන නිලධාරි 2 ශ්‍රීලපාහ
නි/5663 මේජර්
යූඑම්පී උඩුකුමාර ශ්‍රීලපාහ



දෙවන අණ දෙන නිලධාරි
9 (සෙව්) ශ්‍රීලපාහ
**නි/5463 මේජර්**
**එස්ඩී රත්නසිරි ශ්‍රීලපාහ**



උපකරණ පාලන නිලධාරි
රෙජි ශ්‍රීලපාහ නි/64815 මේජර්
එම්එම් වීරරත්න බණ්ඩාර ශ්‍රීලපාහ



විධායක අධිකාරි 17(සෙව්) ශ්‍රීලපාහ
නි/7485 ලුතිනන්
ඩීකේඑස්කේ ගුණසේකර ශ්‍රීලපාහ



විධායක අධිකාරි16(සෙව්) ශ්‍රීලපාහ
නි/8724 ලුතිනන්
කේපීඑන්එස්කේ චන්ද්‍රතිලක ශ්‍රීලපාහ



බුද්ධි නිලධාරි 18 (සෙව්) ශ්‍රීලපාහ
**නි/9884 2/ලුතිනන්**
**ඩීඩබ් ද සිල්වා ශ්‍රීලපාහ**



බුද්ධි නිලධාරි 16(සෙව්) ශ්‍රීලපාහ
නි/9804 ලුතිනන්
එච්පීඑස්පී හන්දසේන ශ්‍රීලපාහ

# THE WHITE HACKLE 84th Issue - April-June 2014

*Pioneer Sri Lanka Army Quarterly and the Journal of the Sri Lanka Light Infantry*

## Content | Page


අදහස් උදහස් හා විවේචන ---- 02
රෙජිමේන්තු අධිපතිගේ 2015 සිංහල අලුත් අවුරුදු පණිවුඩය ---- 03
මැරී මැරුණු මිනිස්සු කෙටි කථාව ---- 04
නව සේනාවිධායක තුමන් පිළිබඳ විස්තරය ---- 05
ශ්‍රීලපාහ ඒකක පුවත් ---- 06
ශ්‍රීලපාහ ඒකක පුවත් ---- 07 - 08
සුබ මොහොතින් නව තනතුරට පත්වීම ---- 09
බුදු දහමින් ජීවිතයට ---- 10
ශ්‍රීලපාහ ඒකක පුවත් ---- 11
සේවාවනිතා පුවත ---- 12 - 13
THE DUCK OF CORNWALL'S LIGHT INFANTRY 14 - 15
ශ්‍රීලපාහ ඒකක පුවත් ---- 16 - 18
උපන්දින සුබපැතුම් ---- 19
ශ්‍රීලපාහ බක්මහ අසිරිය සැමරීම ---- 20 - 21
ශ්‍රීලපාහ අණදෙන නිලධාරීවරුන්ගේ සාකච්ඡාව ---- 22
ශ්‍රීලපාහ ඒකක පුවත් ---- 23 - 26
අරුත් නිරුත්/ Easy Cash ---- 27
ශ්‍රීලපාහ ඒකක පුවත් ---- 28 - 30
SOLDIER LAWYER & DIPLOMAT ---- 31
ශ්‍රීලපාහ ඒකක පුවත් ---- 32 - 33
විශේෂාංග ---- 34
දසුනේ හසුන / මංගල සිතු ---- 35
ශ්‍රීලපාහ දුහුණු පාසල පුවත් ---- 36
ශ්‍රීලපාහ ඒකක පුවත් ---- 37
තල් අරඹේ සිට (විශේෂාංග) ---- 38
ප්‍රහේලිකා අංක 62 ---- 39 - 40




වෙසක් පුන් පොහෝ දින සුවහසක් කුස පිරවූ ශ්‍රීලපාහ සේවාවනිතා මහද්ගෙදාප්කා දන්සැල

12 පිටුව



ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති රෙජිමුඛ ශ්‍රීලපාහ සංචාරයක

17 පිටුව



වසර පහකට පසු පිහිණුම් තරඟයේ අනුශූරතාවය රෙජිමුඛ ශ්‍රීලපාහට

42 පිටුව




## කවරයේ කථාව

සිංහල හින්දු අලුත් අවුරුදු සූර්ය මංගල්‍ය අරුණෝදයෙන් රෙම ශ්‍රීලපාහ අලුත් අවුරුදු උත්සවය වර්ණවත් විය. මෙවරද අති උත්කර්ෂවත් අයුරින් ගැමි සිංහල සංස්කෘතියෙහි එන අවුරුදු ක්‍රීඩා රැසකින් සමන්විත වූ අතර, 2015.04.09 දින රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේවීඩීඑී කරුණාසේකර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී සහ ශ්‍රීලපාහ සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිණිය ද මෙයට සහභාගී විය. එහි විශේෂ අවස්ථා කිහිපයකින් මෙවර කවරය වර්ණවත් වේ.

Printed by

වයිට් හැකල් මුද්‍රණාලය

Sri Lanka Light Infantry
Army Cantonment
Panagoda, Homagama.

T:P: - 0112098133
Ext - 57660
Fax - 0112855204
E-mail - whitehacklesli@gmail.com

# THE WHITE HACKLE

84th Issue - April-June 2014

## SRI LANKA LIGHT INFANTRY QUARTERLY

**Colonel of The Regiment**

Maj Gen KADA Karunasekara RSP USP ndu psc

**Centre Commandant**

Brig MM Kithsiri RSP

**Deputy Centre Commandant RHQ SLLI**

Col GMN Perera RWP RSP

**Adjutant RHQ SLLI**

Maj KY Priyadarshana RSP psc SLLI

**The White Hackle Editors**

**Chief Consultant**

Maj Gen KADA Karunasekara RSP USP ndu psc

**Editor In Chief**

Brig MM Kithsiri RSP

**Assistant Editors**

Maj KY Priyadarshana RSP psc SLLI

**( Adjutant RHQ SLLI )**

Maj AD Gunarathne RSP SLLI

**(Officer In Charge )**

Maj TMAN Thennakoon RWP SLLI

**(Press Officer In Charge)**

**Honourary Consultants**

GenRMDRathnayake(Retd)WWV RWP RSP USP ndu psc

(Reg Force)

Lt Gen HV Atukorale (Retd) VSV psc FBIM

(Reg Force)

Brig AER Abeyesinghe (Retd) KSV

( Vol Force)

**Computer Type setting & Designed**

WO II Gunasiri SHIUK

L / C Suranga RBP

## WHITE HACKLE PUBLICATION

| | |
|---|---|
| **Publisher** | - Regimental Centre<br>Sri Lanka Light Infantry |
| **Telephone** | - 0112855204 / 0112855357 - 59 |
| **Ext** | - 57656 |
| **Fax** | - 0112855204 |
| **E-mail** | - editor.whitehackle@gmail.com<br>editor.whitehackle@yahoo.com |
| **Website** | - www.army/lightinfantry.lk |


# FEEDBACK

## අදහස්, උදහස් හා විවේචන

## Readers Please Write in

The **WHITE HACKLE** the Voice of Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the 84th issue. This quarterly is for members of the SLLI, their families, Ex-Servicemen of SLLI, and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We should not rest on our laurels. Targets have to be set. Greater goals to be achieved. The success of **WHITE HACKLE** depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome in any language (Sinhalese, Tamil and English). What is valued is our making the attempt, and then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through **" THE WHITE HACKLE "**, the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience, go ahead and write in to **" THE WHITE HACKLE "** we are willing to accept and publish. We are happy to hear you and consider your contribution in any form; sketches, cartoons, stories, poems and whatever comes from your thoughts and your pen.

Our Motto is **" Ich Dien", "I Serve"**. Let **'White Hackle'** be a way to serve each other, our Regiment and our country with our banner flying high as it always will. Wishing you all the very best.

-Editor-

# කතුවැකිය

අවුරුදු මාසය නොහොත් බක් මාසය එසේත් නැතිනම් අප්‍රේල් මාසය අපේ රටටත්, එසේම එහි ජීවත් වන සිංහල හින්දු වැසියන්ටත්, සුවිශේෂී වූ සංස්කෘතික වටිනාකමක් ඇති මාසයකි. එදා සිට පැවතෙන්නාවූ හෙල කුළ සිරිතට මුල් තැන දෙමින් අවුරුදු මංගල්‍ය සැමරීම තුළින් අප අපගේ සංස්කෘතියත්, සශ්‍රීක බවත්, එකමුතුකමත්, ලොවට පෙන්වා දෙයි. අවුරුද්දකට වරක් ජ්‍යොතිෂය අනුව එළැඹෙන මේ උතුම් මංගල්‍ය කා බී නටා ගයා සැනසෙන්නට පමණක් සීමාවූ දිනයක් නොවේ. එහෙත් අවුරුද්දක තිබෙන අර්ථය වටහා නොගත් මිනිසුන් ද අප අතර සිටී. නැති නෑකම් ඇති කර ගන්නටත්, නෑකම් තවදුරටත් පවත්වාගෙන යාමටත් මේ බක් මාසය හේතු වී ඇත. පාබල හමුදා සාමාජිකයින් වන අප ද අප ගෙදර දොරේදී මෙන්ම කඳවුරු පරිශ්‍රය තුළදී ද බක්මහේ අසිරිය වාර්ෂිකව සමරන්නට පුරුදු වී සිටිමු. ගෙවුනු වසරේ අප ලද දියුණුව දෙස බලමින් අප අතින් සිදුවූ අඩුපාඩු හදා වඩා ගන්නටත් ලබන වසරේ එය තවත් සාර්ථක කරගන්නටත් මේ බක්මහේ චාරිත්‍ර වාරිත්‍ර තුළින් සිත් සතන් තුළ සටහන් තබා ගනිමු. පාබල හමුදා සියලු විරුවන්ටත්, ඔවුන්ගේ පවුල්වල සාමාජික සැමටත් මුලු මහත් ශ්‍රී ලංකාවාසී සැමටත් සැබෑ බක්මහේ අසිරිය තුළින් වාසනාවන්ත වසරකට ආසිරි පතන්නෙමු.

The White Hackle is published quarterly under the supervision of the Regimental Centre Commandant to educate the Sri Lanka Light Infantry Officers and men on various topics including news, information on activities, people, policies, operations, technical developments, views, opinions and ideas to satisfy their reading thirst. Manuscripts of interest to the Regiment are invited. Direct Communication is authorized. The White Hackle, Regimental Centre, Army Cantonment, Panagoda, Homagama. Phone 0112855204 or 0112855356-60 Extn. 57656. Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. Publication of this periodical is authorized by the Dte, of PA Army HQ CBO by letter No. A/275/27 of 16 Mar, 94. Use of funds for printing of this Publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at

# රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාව රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඩීඩබ්ලිව් කරුණාසේකර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී විසින් නිකුත් කරනු ලබන 2015 සිංහල හා හින්දු අලුත් අවුරුදු පණිවුඩය

සූර්යයා මීන රාශියේ සිට මේෂ රාශියට සංක්‍රමණය සනිටුහන් කරමින් 2015 අප්‍රේල් මස 14 වන දින උදාවන සිංහල හින්දු අලුත් අවුරුදු දිනය වෙනුවෙන් ශ්‍රී ලංකාද්වීපයට සාමයේ අරුණාලු උදාවී ඇති මෙවන් මොහොතක ඔබ සැම වෙනුවෙන් ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති වශයෙන් සුබාශිංසන පණිවුඩයක් නිකුත් කරනුයේ ඉමහත් අභිමානයෙන් හා හදපිරි සතුටිනි.

යුද්ධය ජයග්‍රහණය කළද ඉදිරියේදී සෙබළුන් වන අපහට අභියෝග රාශියකට මුහුණුදීමට සිදුවී ඇති අතර, එම අභියෝග ජයගත හැකි වන පරිදි වෘත්තීමය දක්ෂතාවයෙන් හෙබි සෙබළුන් වීමට අප සැම තරයේ අදිටන් කරගත යුතුය. එමෙන්ම රෙජිමේන්තුව තුළ සිදුවන සංවර්ධන ක්‍රියාදාමයන්ට සෘජුවම හෝ වක්‍රව දායකත්වය ලබාදීම තුළින් ඉදිකරමින් පවතින රණවිරු ස්මාරකයේ සියලු වැඩ කටයුතු අවසන් අධියරේ පවතින අතර, ඒ සඳහා ඔබ වෙතින් පිළිබිඹු කරන්නට වූ වෘත්තීය නිපුණත්වය/ මානෂිකත්වය සහ එකමුතු භාවය ඉදිරි රාජකාරි කටයුතු වලදී ද යොදාගනිමින් රෙජිමේන්තුවක් ලෙස අප ගොඩනගාගත් කීර්තිනාමය තවදුරටත් වර්ධනය කරගනිමින් ශ්‍රී ලංකා යුද හමුදාව තුළ අභිමානවත් රෙජිමේන්තුවක් වශයෙන් ඉදිරියට යන ගමන මා ඉතා අගය කොට සලකමි. සිංහල සහ හින්දු අලුත් අවුරුද්ද අපගේ සශ්‍රීකත්වයේ මංගල්‍යයයි. යුද්ධ හමුදා සම්ප්‍රදායයන් සමස්ත ජනසමාජයට අදර්ශයක් වන අයුරින් අඛණ්ඩව පවත්වා ගෙන යාමට පාබල හමුදාව සෑම විටම ක්‍රියාකර ඇති අතර, දේශීය අනන්‍යතාවය රැකෙන අයුරින් චිරාත් කාලයක සිට පැවත එන හෙළ සිරිත් විරිත් මතු පරපුර වෙත දායාද කිරීම පාබල සාමාජිකයන් වන අපගේ පූර්ණ වගකීම හා යුතුකම බැවි මා මෙම අවස්ථාවේදී පෙන්වා දෙන අතර, එහි සුවිශේෂී සංදිස්ථානයක් ලෙස 2015 සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සැමරීම පෙන්වා දිය හැක.

පසුගිය දශක තුනක් පුරාවට පැවති යුද වාතාවරණය මත පාබල සෙබළුන් වන අප හට ඥාතීන් සමඟ එක්ව නව අවුරුදු උදාව සැමරීමට නොහැකි වූ නමුත් අපගේ කැපවීම මත උදාවූ සාමයත් සමග සියලු රණවිරුවන් හට නෑ සිය මිතුරන් සමග ඉතා සතුටින් අවුරුදු සැමරීමට හැකි පරිසරයක් උදා කර දීමට හැකිවීම අප ලැබූ ජයග්‍රහණය සාමයේ විජයග්‍රහනයක් වන බව නිහතමානීව නැවතත් සිහිපත් කරමි.

එක්සත් මව්බිමක සාමයේ අරුණාලු භුක්ති විඳින මේ මොහොතේ සාමය ළඟාකර ගැනීමට මංපෙත් විවර කිරීම සඳහා ප්‍රාන දානයෙන් දායක වූ භාරදූහසකට ආසන්න අපගේ පාබල රණවිරුවන්ගේ ඥාතීන් හා හිතමිතුරන්, තම පුතණුවන්, තම ස්වාමිපුරුෂයා, තම පියාණන් නොමැතිව මෙම අවුරුදු උදාව සමරනු ලබල බැවි අප මෙම අවස්ථාවේදී අමතක නොකළ යුතුය. අප සියලු දෙනා හට මෙම නව අවුරුදු උදාව ඔවුන් සමග එක්ව සැමරීමට නොහැකි නමුත් මාගේ සුවිශේෂී අවුරුදු ශුභාශිංසනය සමස්ත පාබල හමුදාව වෙනුවෙන් මා මෙම අවස්ථාවේදී ඔවුන් වෙත සංවේදීත්වයෙන් යුතුව පිළිගන්වන්නෙමි. තවද, කාය දානයෙන් දායකත්වය ලබාදී මේ වන විට ආබාධිත තත්ත්වයට පත්වූ අපගේ රණවිරුවන් හටද ඔවුන්ගේ ඥාතීන් හටද, ශුභාශිංසනය එක් කිරීමට මා මෙය අවස්ථාවක් කර ගන්නෙමි.

අවසාන වශයෙන් ශ්‍රී ලංකා පාබල හමුදාවේ සියලුම නිලධාරීන්, සෙසුනිලයින් ඇතුලු ඔවුන්ගේ පවුල්වල සියලුම සාමාජිකයන්ටත්, සිවිල් සේවක මහතුන් ඇතුලු එම පවුල් වල සියලුම සාමාජිකයින්ටත්, ලැබුවා වූ මෙම සිංහල හා හින්දු අලුත් අවුරුද්ද යස ඉසුරින් සපිරි සෞභාග්‍යමත් සුබ අලුත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරන අතර, සෑම භාරදූර්ය කාර්යක්ම ඉටුකිරීම සඳහා ඔබ සැමට තෙරුවන් සරණ හා සියලු දෙවියන්ගේ ආරක්‍ෂාව ලැබේවායි මා ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

2015 අප්‍රේල් මස 14 දින

කේඩීඩබ්ලිව් කරුණාසේකර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී
මේජර් ජෙනරාල්
රෙජිමේන්තු අධිපති ශ්‍රී ලංකා පාබල හමුදාව

කෙටි කතාව

# මැරි මැරුණු මිනිස්සු



රචනය :
මේජර් ඒඩී ගුණරත්න ආර්එස්පී

සිහිල් සුළං රැල්ලක් පලාලි ගුවන් තොටුපල සිසාරා ඇදිලා ගියා. ඒත් ඒ සාමාන්‍ය සුළඟක්ම නොවේ. ක්ෂණයකින් ගුවන් පථයට ළඟාවූ විශාල ගුවන් යානය මුලු පළාතම දෙවනත් කළා පමණක් නොවේ. ලොකු සුළඟකුත් අවට පරිසරයට එක්කලා. මේ දිනවල මේ දර්ශණය පලාලි ගුවන් තොටුපලටත් ගුවන් පථයටත් සාමාන්‍ය දෙයක් බවට පත්වෙලා. රෑ දවල් නැතුව දකුණේ සිට යුද්ධයට සොල්දාදුවන් රැගෙන ඒමත් ඒ වගේම බඩුභාණ්ඩ අවි ආයුධ රැගෙන ඒමත් සිදු කරනු ලබයි. දින හත අටක ලැබී ඇති නිවාඩුව නිමාකර තමන්ගේ දෙමාව්පියන් බිරින්දෑවරුන් දරුවන් ගෙන් සමුගෙන යළි යුද බිමට පැමිණෙන සොල්දාදුවන්ගේ මුහුණු දෙස මොහොතක් සූක්ෂම ලෙස ඒබී බලමු. ඇත්තටම සතුටක් නම් ගෑවිලාවත් නැත. ඒත් … බියක් හෝ පරාජිත බැල්මක් නම් ඒ මුහුණුවල සටහන් වී නැති බව කිව හැකියි.

ඒ මොහොතේ රැගෙන ආ බඩුභාහිරාදිය හා පැමිණි සොල්දාදුවන් ගොඩ බස්සවා නිමවූ විගසම කොළඹ බලා යන සොල්දාදුවන් පේළියක ආකාරයට ලහි ලහියේ ගුවන් යානය වෙත එමින් සිටී. වදින වේගවත් සුළඟට එරෙහිව පැලඳ සිටි හිස්වැසුම් ද, ගලවා සාක්කුවල ඔබා ගනිමින් ධෛර්යයෙන් යුතුව එන අයුරු හිතට තවත් සවියක් එක් කරයි. සතුරු බළමුලුවලට එරෙහිව වෙඩි උණ්ඩ හමුවේ මුහුණට මුහුණලා ඇදෙන මේ සොල්දාදුවන්ට ගුවන් යානයෙන් නික්මෙන සුළඟ ඇත්තටම බාධකයක් නොවේ. දෙපසින් පැමිණෙන මේ සොල්දාදුවන්ට ප්‍රථම ගිලන් මැසි මත තබා රැගෙන එමින් සිටි යුද බිමේ තුවාල වූ සොද්දාදුවන් පළමුව ගුවන් යානයට ඇතුල් කරන ලදී. මේ දසුන් මේ දිනවල පලාලි ගුවන්තොටේ සුලභ දර්ශණයක් වී තිබේ.

යුද බිමේ තුවාල ලබන විරුවන් පමණක් නොවේ මියයන විරුවන්ද එමටයි. ඔවුන්ගේ නිසල දේහයන්ද නිතරම මේ ගුවන් තොටෙන් රත්මලාන හා අනුරාධපුර ගුවන් තොටුපලවල් බලා පිටත් කර හරිනු ලැබේ. ගුවන් යානය හෝස් යන හඬ නගා නිහඬ වූ විගස ගුවන් සෙබළුන් ඊළඟ ගුවන් වාරය සඳහා ඇවැසි සැපයුම් සොයා බැලීම සඳහා වේගයෙන් ගුවන් යානය වෙත පැමිණෙනු දක්නට ලැබේ. ඒ අතරම සුදු පැහැති දිගටි හැඩයේ බහාලුම් කිහිපයක්ම ගුවන් යානයට පැටවීම සඳහා ගෙන එනු ලැබෙයි. එහෙත් ඒ රණබිම තම ජිවය මව්බිමට නිදහස් කළ විරුවන්ගේ නිසල දේහයන් බව දන්නෝ දනිති. ගුවන් තොටේදි ඔවුන් සියලු දෙනාට ගෞරව උත්තමාචාරය දක්වා ගුවන් යානයට ඇතුල් කරන ලදි.

මේ දිනවල ඉදිරි ආරක්ෂක වළලුවල දැඩි සටන් පවති. කෙසේ හෝ එම ඉදිරි ආරක්ෂක වළලුවලට පහරදී අල්ලා ගැනිම සතුරන්ගේ එකම අභිප්‍රාය වී ඇත. එහෙත් එකා පිට එකා වැටුන ද තමන්ගේ බිමෙන් එක අඟලක් දිමට අපේ වීර සෙබළුන්ද එකඟ නැත. උතුරේ දැඩි සටන් ඇවිල යන යුගයක් වුවත් හසලක ඉපිද දුෂ්කර පිවිතයක් ගත කරමින් අපොස (සාපෙළ) දක්වා උගත් සරත් බණ්ඩාර ට උතුරේ යුද්ධයට යාමට ආශාවක් ඇති විය. ඒ බැව් මවට දැනුම් දුන් විට අම්මා ක්ලාන්ත වුවාය. එහෙත් මේ මව්බිමට තම ප්‍රානය පුද කළ හසලක ගාමිණී වැන්නවුන් ගැන සරත් බණ්ඩාර මවට මතක් කර දී ඒ ශෝකය ටිකෙන් ටික තුනිකර තම පුතෙකු යුධ බිමට යවා සතුරාගෙන් තම රට නිදහස් කර ගැනිමේ හීන පිලිබඳව තම මවගේ සිතතුල ආඩම්බරයක් ඇති කරවිය. එහෙත් මේ අතරතුර සරත් බණ්ඩාර යන ගමනට තවත් අයෙකු එකතුවන්නට වෙර දරනු දැනගන්නට ලැබුණි. ඒ අන් කෙනෙකු නොව ඒ වන විට යන්තම් අවුරුදු 18 සපුරා සිටි ඔහුගේ එකම බාල සොහොයුරා  සුමිත් බණ්ඩාර ය. තමන්ට සිටි පුතුන් දෙදෙනා මෙවැනි යුද උණුසුමක් පවතින වාතාවරණයකදි යුද බිමට යවන්නට කැමති වන මවක් සිටී ද, එහෙත් ඔවුන්ගේ දැඩි පෙරත්තය නිසා මව අවසන ඒ සියල්ලටම කැමැති විය.

සරත් බණ්ඩාර යම්තම් අවුරුදු 22 සැපුරුවා පමණි. සරත් සහ සුමිත් ගමේ හා පාසලේ කා අතරත් හොද හිත දිනාසිටි හිරිමල් යෞවනයේ සිටි තරුණයින් දෙදෙනෙකු විය. සරත් බණ්ඩාර ගමේ පාසලේ ක්‍රීඩා අංශයෙහි සුවිශේෂි දස්කම් පෑ දිප්තිමත් ශිෂ්‍යයෙකු විය. ගමට පාසලට පමණක් නොව මේ තරුණයින් දෙදෙනා ගමේ පන්සලට ද නැතුවම බැරි චරිත දෙකක් විය. පියා මියගිය දින සිට මේ දෙදෙනා උස් මහත් කරන්නට මේ මව විදි දුක් එමටය. මේ මවගේ දාබිඳු නොසැලුණු ගමේ කුඹුරක ලියද්දක් නැති තරම් විය. එසේ උස් මහත් කළ මේ පුතුන් දෙදෙනා මරණය පෙනි පෙනි යුද හමුදාවට බැදි සටන් බිමට යන්නට සුදානම් වෙද්දි ඇයට දුකක් නොදැනුනේ නම් එයද අරුමයකි. අවසානයේදි ඔවුන් හට යන්නට අවසරය දුන්නද ඔවුන් නිවසේ නොමැති වේලාවල්වලදි ඇය තනියෙන් හැඩූ වාර අනන්තයි. රෑය පහන්වන තුරා ඇය නොනිදා හඬා තිබුණි. "අම්මේ අම්මා අඩන්න එපා අම්මේ අපි යුද්දෙට ගියේ නැත්තම් කවුද යුද්දෙට යන්නේ." දවසක අපේ මේ වැට කඩුල්ල ළඟටත් සතුරන් එනකන් අපි බලා ඉන්න එක හරිද ? සරත් දවසක අම්මාගෙන් අසන විට සුමිත් ද නිහඬව සිටියේ නැත. ඒක තමයි අයියේ අපි මැරෙණවානම් ගෙදර හිටියත් මැරෙණවා. ගෙදර ඉදලා නිකන්ම නිකන් නිකමෙක් වගේ මැරෙණවාට වඩා හොදයි වීරයෙක් වගේ සතුරෝ එක්ක සටන් කරලා මැරෙණවා… මේ සහෝදරයින් දෙදෙනා ගැන මවට දැනුනේ මහත් ආඩම්බරයකි.

ඉතිරි කොටස ලබන කලාපයේ පළවේ



# 24th CENTRE COMMANDANT

## OF THE SRI LANKA LIGHT INFANTRY REGIMENT



**Brigadier MM Kithsiri RSP, the Commandant of the Sri Lanka Light Infantry Regiment who joined the Regular Force of the Sri Lanka Army as an officer cadet on 16 January 1986. After completion of basic military training at Sri Lanka Military Academy Diyatalawa, he was commissioned in the rank of Second Lieutenant on 28 March 1987.**



After commissioning, he was posted to the 1st battalion Sri Lanka Light Infantry as a Platoon Commander on 01 April 1987. He performed duties as the Officer Commanding of the 6th battalion Sri Lanka Light Infantry since 13 January 1991 in Rifle Company and served as the Officer Commanding of the 7th battalion Sri Lanka Light Infantry for over three years in C coy and Admin Company. The appointment of Officer Commanding which possesses delegating of legal power of the Commanding Officer benefitted him to take tactical decisions in addition to handling of administrative matters over five years in 6th and 7th battalions Sri Lanka Light Infantry.

He served as the Officiating Second in Command in the 10th battalion Sri Lanka Light Infantry on 24 December 1997. He took over duties as the Second in Command of 12th battalion Sri Lanka Light Infantry and 10th battalion Sri Lanka Light Infantry for five years, which enabled him to shoulder all administrative matters pertaining to all soldiers of the battalion. Handling of Imprest Accounts and auditing all sub accounts of the battalion are the key responsibilities assigned to a Second in Command.

He was advantaged to Command and direct men for the victorious Humanitarian War during his tenure as the Commanding Officer of the 4th battalion Sri Lanka Light Infantry from 30 September 2004 to 12 February 2007. At the time of terminating the Humanitarian War he was the Commander of 525 Brigade which was consisted of four battalions. He commanded 525,613,533 and 111 Brigades where he was able to exercise his command at operational level nearly six years. He held appointment as the Commandant of Language Training School Kotmale. He participated in UN peace Keeping Mission in Haiti as the Second in Command of the 6th UNPKO bn and as the Commanding Officer of the 16th UNPKO bn. He held Staff and Instructor appointments in places such as GSO II at 211 Brigade, Platoon Commander, Sri Lanka Military Academy, Diyathalawa and Officer Commanding, Training Wing, Army Training School, Maduruoya.

He followed overseas courses such as Young Officers' Course in India from 12 February 1995 to 16 June 1995, MID Career Course in Pakistan from 24 March 1997 to 14 June 1997 and Senior Command Course in India from 09 March 2009 to 30 May 2009 which facilitated him to share the knowledge and experiences with foreign officers and instructors as well. He has followed certificate and diploma course in the field of HR/IHL, Disaster Management and Psychological and Counseling from University of Peradeniya, Ruhuna and Colombo respectively.





# 65 වන බළඇණි සංවත්සරය

## 1 ශ්‍රීලපාහ පුවත්



ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රථම නිත්‍ය පාබල ඒකකය ලෙස 1 වන බළඇණිය ශ්‍රීලංකා පාබල හමුදාව 1950 ක් වු මැයි මස 12 වන දින ස්ථාපනය කළ අතර, 2015.05.12 දින අභිමානවත් 65 වන සංවත්සරය පනාගොඩ කඳවුරේදී මහත් උත්සවාකාරයෙන් සමරන ලදී.

1954 වසරේ අප්‍රේල් මස 21 දින අති උත්තම රාජවංශික II වන එලිසබෙත් මහා රැජින විසින් අප බළඇණිය වෙත රැජිණ වර්ණ හා රෙජිමේන්තු වර්ණ ප්‍රදානය කරන ලදී. ඉන් අනතුරුව 1978 ඔක්තෝබර් මස 10 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පූර්ණ බලැති විධායක ජනාධිපති ගරු ජේආර් ජයවර්ධන ශ්‍රීමතානන් විසින් ජනාධිපති වර්ණ හා රෙජිමේන්තු වර්ණ ප්‍රදානය කරන ලදී. මේ අනුව ඉටු කරන ලද සේවය වෙනුවෙන් ලැබිය හැකි උතුම්ම සම්මාන අප බළඇණිය විසින් ලබාගෙන ඇත.

දසක 03 ක් පුරා පැවති කුරිරු ත්‍රස්තවාදය මුලිණුපුටා දැමීම සඳහා අභීතව සටන් වදිමින් බිඳිය නොහැකියැයි ත්‍රස්තවාදින් විසින් රැකගෙන සිටි මුහමාලේ පළමු ආරක්‍ෂක වළල්ල නොකඩවා දින 05 ක සටනකින් පසු අත්පත්කර ගත් මෙම බළඇණිය ඉන් නොනැවති උතුරු මානුෂීය මෙහෙයුමට ජීවය දෙමින් 55 සේනාංකය යටතේ නාගර්කෝවිල්, පලෙයි, කෙවිල්, චුන්ඩිකුලම්, චලෙයි හරහා පුදුමාතලන් අවසන් පස් බැම්ම දක්වා ජයග්‍රාහි ලෙස හටපිරිස් ගමන් කළ අතර, අවසන් මානුෂීය මෙහෙයුමේදී පමණක් නිලධාරීන් 05 දෙනෙකු හා සෙසුනිලයින් 73 දෙනෙකු මියයන ලදී.එමෙන්ම නිලධාරින් 06 දෙනෙකු හා සෙසුනිලයින් 405 දෙනෙකු තුවාල සිදු වූහ. කුරිරු ත්‍රස්තවාදය පරාජය කර අපලත් ජයග්‍රහණයන් විජග්‍රහණයක් බවට පත්කර ලීමට උපරිම දායකත්වයක් ලබා දුන් මෙම බළඇණිය මේ වන විට 53 වන සේනාංකය යටතේ 533 බළසේනා මූලස්ථානයට අනුයුක්තව රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ පනාගොඩ කඳවුරේ ස්ථානගතව යුද්ධ හමුදාපති අතිරේක බළඇණියක් වශයෙන් රාජකාරි ඉටු කරනු ලබයි.

65 වන බළඇණි දිනය අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඩීඑල්යු තාබෘ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහගේ නිසි මඟ පෙන්වීමෙන් ආගමික කටයුතු වලට මුල්තැන දෙමින් මාතෘභූමිය වෙනුවෙන් සටන් බිමේදි ජීවිතය පරිත්‍යාග කළ හා ආබාධිත තත්ත්වයට පත් සියලුම රණවිරුවන් සිහිපත් කරමින් 2015.04.29 දින නවගමුව දේවාලය වෙත ගොස් ආගමික වතාවත් ද, එදින සවස පනාගොඩ රොම්යෙල් මාවතේ ශ්‍රී ශාඛාරාමයේදී බෝධිපූජා පිංකමක් ද, 2015.05.04 දින හෝමාගම ක්‍රිස්තියානි දේවස්ථානයේදී දේව මෙහෙයක් ද, 2015.05.05 දින මහනුවර ශ්‍රී දළදා වහන්සේ වෙත ගිලන්පස පූජාවක් සහ 2015.05.06 දින ශ්‍රී දළදා වහන්සේ වෙත හා මහා සංඝයා වහන්සේලා 25 නමක් සඳහා දහවල් දානය ද පූජා කරන ලදී. 2015.05.08 වන දින සහ 2015.05.09 වන දින කතරගම මහා දේවාලයට හා කතරගම කිරිවෙහෙර වහන්සේ වෙත කිරි ආහාර පූජාවක් ද, පවත්වන ලදී. 2015.05.10 වන දින අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස දී බෝධි පූජාවක් පවත්වා ඒකක ධජයන්ට හා මියගිය රණවිරුවන්ට ද, පිංපමුණුවා නිවන්සුව ප්‍රාර්ථනා කිරීම හා ආබාධිත රණවිරුවන්ට ද, නිරෝගි ඉක්මන් සුවය ද, සේවයේ යෙදි සිටින අයවලුන් හට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත් සෙත් ප්‍රාර්ථනා කරන ලදී.

2015.05.12 දින අණදෙන නිලධාරි වෙත සම්මාන මුරයක් හා වර්ණ ධජ සහිත සම්මාන පෙළපාළියක් පවත්වා එදින සියලු නිල දිවා භෝජන සංග්‍රහයක් ද රාත්‍රියේ ඕල් රයිට් සංගීත කණ්ඩායම හා ජනප්‍රිය ගායක ගායිකාවන් ගේ මියුරු හදට රෙඩ් ඇරොව් කණ්ඩායමේ නර්ථනය ද එක්විය. මෙදින රෙජිමේන්තු අධිපති ගේ ප්‍රධානත්වයෙන් සුහද හමුවක් රෙජිමේන්තු මධ්‍යස්ථානය තුළදි පවත්වන ලදී.





16(සෙවි) ශ්‍රීලපාහ

## පුවත්

# බළඇණි පුහුණුවීම්

### පුහුණුවේදී දහඩිය හෙලන්නා යුද බිමේදී රුධිරය නොහෙලයි..







16 වන ස්වේච්ඡා බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ බළඇණි සාමූහික පුහුණුව අම්පකාමම් විස්ඩම් පුහුණු පාසලේදී 2015.02.10 වන දින ආරම්භ කරන ලදී. 574 බළසේනාධිපති කර්නල් එන්සී සෝමවීර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී විසින් ආරම්භක දේශණය සිදුකරමින් පුහුණුවේ ඇති වැදගත්කම පිළිබඳව මනා අවබෝධයක් ලබාදුන් අතර, මෙම පුහුණුව සඳහා නිලධාරීන් 10 ක් හා සෙසුනිලයින් 290 ක් පුහුණුව සඳහා සහභාගී වූහ.

පුරා දින 45 ක කාලයක් සෙබළාගේ දරාගැනීමේ හැකියාව, සාමූහිකව වැඩ කිරීමේ හැකියාව වර්ධනය කිරීම, යුද න්‍යාය මෙන්ම සිවිල් ජීවිතයට ද වැදගත් වන කරුණු රාශියක් දේශන සහ ප්‍රයෝගික පුහුණුවීම් ඇසුරෙන් අවබෝධයක් ලබාදෙන ලදී. ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් එච්ඒඩීඑම් සරත්චන්ද්‍ර ශ්‍රීලපාහ ගේ මඟ පෙන්වීම යටතේ දෙවන අණදෙන නිලධාරී මේජර් බීඑම්ටීබී රත්නායක ශ්‍රීලපාහ සහ ඒකක පුහුණු භාර නිලධාරී ඒඒඑන්බී අතුරුගිරි ශ්‍රීලපාහ ගේ උනන්දුව හා කැපවීම මත මෙම පුහුණුව සාර්ථකව අවසන් විය. අධ්‍යක්ෂ පාබල මේජර් ජෙනරාල් එල්ඩබ්ලිව්සීපීපී රාජගුරු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එල්ඩීඑම්සී විසින් පුහුණුවීම් සිදුකරන ආකාරය පිළිබඳව සොයාබැලීම සඳහා පැමිණෙන ලදී. එහිදී කළමනාකරණය පිළිබඳව දේශනයක් ද සිදු කරන ලදී.

2015.03.26 වන දින බළඇණි පුහුණුව අවසානයේ කණ්ඩායම් අතුරින් දක්ෂතා දැක්වූවන්ට කුසලාන හා සහතික පත්‍ර පිරිණැමීම සිදු කළහ. හොඳම කණ්ඩායම ලෙස "බී" කණ්ඩයම ද, දක්ෂතම වෙඩික්කරු සෙ/22ඩී00450 කෝප්‍රල් කුමාර එස්එස්එස් ද, අතිශූර සෙබළා සෙ/22ඩී00114 කෝප්‍රල් ගුණතිලක ඩීපීඑස්ආර් ද, පාඨමාලාවේ සෑම අතින්ම දක්ෂතම සෙබළා සෙ/14ඩී01548 බනි11 හේරත් එච්එම්ජ්බී ද, කුසලාන ලබාගන්නා ලදී. තවද මෙතෙක් කලක් විස්ඩම් පුහුණු පාසලේ බාධක තරණයේ තබා තිබූ වාර්තාව වන විනාඩි 16.33 ක කාලය බිඳහෙලමින් විනාඩි 15.03 කින් නිමකළ සෙ/16ඩී00382 ලාකෝ ජයවර්ධන කේඑම්ආර්ජීකේ විසින් පාඨමාලාවේ හොඳම ශාරීරික යෝග්‍යතාවයට හිමි ත්‍යාගය දිනාගැනීමද කැපී පෙනෙන අවස්ථාවක් විය. 572 බළසේනාධිපති කර්නල් කේඒඑන්එන් කොස්වත්ත ආර්එස්පී ගේ දේශණයෙන් පසු බළඇණි පුහුණු පාඨමාලාව නිමා වන ලදී. තවද මෙම පුහුණු පාසලට ඒකක නිලධාරීන් හා සෙසුනිලයින්ගේ මූල්‍යමය දායකත්වයෙන රුපියල් 54,500.00ක් වටිනා ජල පොම්පයක් ලබා දුන් අතර, අණදෙන නිලධාරී විසින් එය පරිත්‍යග කරන ලදී.





# 4 ශ්‍රීලපාහ පුවත්

## 17 වන අණදෙන නිලධාරීගේ සම්ප්‍රාප්තිය

වසර 28 ක දීර්ඝ ඉතිහසයකට උරුමකම් කියන 4 වන ශ්‍රී ලංකා පාබල හමුදාව මේ වන විට අණදෙන නිලධාරීන් 16 දෙනෙකුගේ නායකත්වය හොබවා ඇති අතර, 2013 වර්ෂයේ හොදම නිත්‍ය බළඇණිය ලෙස අභිෂේක ලැබීය.

2015.04.17 වන දින නව අණදෙන නිලධාරි ලෙස ලුතිතන් කර්නල් ජේකේආර්පී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ගේ පැමිණීම සිදු වන ලදී. එතුමන්ට ඒකකය වෙතින් කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීමෙන් අනතුරුව 1005 පැයට යෙදුනු සුභ මොහොතින් ආගමික වතාවත් සිදු කොට පොල් තෙල් පහන දල්වා තම තනතුරේ වැඩ භාර ගන්නා ලදී. ඉන් අනතුරුව දෙවන අණදෙන නිලධාරි මේජර් කේපීසී ධර්මසිරි ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ විසින් ඒකකයේ වත්මන් තත්ත්වය පිළිබඳ අණදෙන නිලධාරි වෙත පැහැදිළි කිරීමක් සිදු කරන ලදී. ඉන්පසු බළඇණි මූලස්ථානය ඉදිරිපිට අඹ පැලයක් රෝපණය කිරීමෙන් අනතුරුව නව අණදෙන නිලධාරි විසින් භටපිරිස් ඇමතිම සිදු කළේය. ලුතිතන් කර්නල් ජේකේආර්පී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ වසර 23කට අධික යුද හමුදා සේවා කාලය තුළ කණිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ නිලධාරිවරයෙකු වශයෙන් දැරිය යුතු සියලුම තනතුරු හොබවා දේශීය හා විදේශීය පාඨමාලාවන් හදාරා ක්‍රියාන්විත



මෙන්ම පාලන රාජකාරි සම්බන්ධයෙන් මනා දැනුමක් හා පලපුරුද්දක් ඇති යුද හමුදාවේ අත්දැකීම් බහුල නිලධාරිවරයෙකු වේ. ඉදිරියේදී නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේද සහයෝගය නොමදව ලැබ ඒකකයේ ඉදිරි අභිවෘද්ධිය පිණිස නායකත්වය ලබාදෙන්නට නව අණදෙන නිලධාරි තුමන් හට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථාන කරන්නෙමු.

## මුල්ලියාවේලි ජනතාව වෙනුවෙන් පැවැත්වූ 4 ශ්‍රීලපාහ බක්මහ උළෙල



සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් 592 බළසේනාධිපති ගේ පූර්ණ අධීක්‍ෂණය මත 4 ශ්‍රීලපාහ ඒකකය හා 20 (සේවි) ගැජේබ ඒකකයේ පූර්ණ දායකත්වයෙන් 2015.04.19 දින මුල්ලියාවේලි විද්‍යානන්ද විද්‍යාලයේදී ඉතා උත්කර්ෂවත් ලෙසින් බක්මහ උළෙලක් පවත්වන ලදී. ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ජේකේආර්පී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ගේ ආරාධනාවෙන් 59 සේනාංකාධිපති බ්‍රිගේඩියර් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් පැමිණෙන ලදී. එහිදී අවුරුදු උත්සවයේ ජයග්‍රාහකයන් හට ත්‍යාග ප්‍රදානය කිරීමෙන් පසු සංගීත ප්‍රසංගයක්ද පවත්වන ලදී.

## 28 වන බළඇණි දිනය සමරමින්



28 වන බළඇණි දිනයට සමගාමීව 2015.05.01 වන දින අණදෙන නිලධාරි ප්‍රමුඛ නිලධාරීන් හා සෙසුනිලයින් ගේ සහභාගිත්වයෙන් අනුරාධපුර ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේ අභියසදී ඒකක ධජයට සෙත් පැතීම සහ 2015.04.30 දින දළදා මාලිගාවේ පූජාවක් ද, සියලුම කණ්ඩායම්වල සහභාගිත්වයෙන් අත් පන්දු, ක්‍රිකට්, කඹ ඇදීමේ තරගා වලියක් හා ප්‍රථම වරට පාපැදි තරගාවලියක් ද, සංවිධානය කරන ලදී. මීට අමතරව 2015.05.01 දින වට්ටප්පලෙයි අම්මාන් කෝවිලේ පූජාවක් පැවැත් වූ අතර, 2015.05.05 වන දින ඒකක අණදෙන නිලධාරි වෙත සම්මාන මුරයක් හා සම්මාන පෙළපාළියක් පිරිනමන ලදී. මෙදින සියලු නිලයින්ගේ සහභාගිත්වයෙන් දිවා භෝජන සංග්‍රහයක් ද, සන්ධ්‍යාවේ ඒකක චතුරංග අධිරිද්ම සංගීත කණ්ඩායම විසින් සංගීත ප්‍රසංගයක් ද පවත් වන ලදී.

බුද්ධි අංශය 4 ශ්‍රීලපාහ

# සුබ මොහොතින් නව තනතුරට පත් වූ ඔබට

## රෙජිමේන්තු අධිපති ඇතුලු සියලුම නිලයින්ගේ උණුසුම් සුබ පැතුම්...



රෙජිමේන්තු සැරයන් මේජර්
1 ශ්‍රීලපාහ
සෙ/309693 ඔනි I ඩබ්ලිව්එම්පී වීරසිංහ



රෙජිමේන්තු සැරයන් මේජර්
16(සෙවි) ශ්‍රීලපාහ
සෙ/2ඩී03136 ඔනි I එස්ආර් සුනිල්



රෙජිමේන්තු සැරයන් මේජර්
15 ශ්‍රීලපාහ
සෙ/307019 ඔනි II මාරක්කුලි එච්එම්පී



රෙජිමේන්තු උපකරණ පාලන
සැරයන් මේජර් 15 ශ්‍රීලපාහ
සෙ/313868 ඔනි 11 ජයන්ත ටීපී



රෙදපාසැමේ 20 ශ්‍රීලපාහ
**සෙ/311810 ඔනි 11**
**ලක්මාල් බීජීඑච්**



රෙදපාසැමේ 18 (සෙවි) ශ්‍රීලපාහ
**සෙ/14ඩී00206 ඔනි 11**
**මානවසිංහ ඊජීසී**



සරඹ උපදේශක 12 ශ්‍රීලපාහ
**සෙ/314814 ච/සැරයන්**
**ප්‍රේමකුමාර ආර්එම්ඩී**



ප්‍රධාන ලිපිකරු 6 ශ්‍රීලපාහ
**සෙ/316511 සැරයන්**
**නිශාන්ත කුමාර ඒඑම්පී**



සරඹ උපදේශක 10 ශ්‍රීලපාහ
**සෙ/317143 සැරයන්**
**නුවන් කුමාර පීපී ආර්එස්පී**



ප්‍රධාන ලිපිකරු 20 ශ්‍රීලපාහ
සෙ/315998 සැරයන්
වන්නිනායක ඩබ්පීඊ



ප්‍රධාන ලිපිකරු 2 (සෙවි) ශ්‍රීලපාහ
සෙ/2ඩී02548 කෝප්‍රල්
වසන්ත ඩබ්ඊ



# බුදු දහමින් ජීවිතයට

සක් දෙවිඳු විසින් මෙහෙයවන ලද එක්තරා දිව්‍ය පුත්‍රයෙක් බුදුරඳුන් කරා එළඹ පිරිහීමේ දොරටු කවරහුදැයි විමසීය. ඉක්බිති තථාගතයන් වහන්සේ ඒ වෙනුවෙන් පරාභව සූත්‍රය දේශනා කළ සේක. මෙහි සඳහන් වනුයේ එම දේශනයේ සංක්ෂිප්තයයි.

**1 දහමට අකමැති බව**

වැඩෙන්නා වූ තැනැත්තා ද, පහසුවෙන් දැනගත හැකි වේ. පිරිහෙන්නා වූ තැනත්තා ද, පහසුවෙන් දැනගත හැකි වේ. දස කුසල ධර්මයට කැමති වන්නේ වැඩෙන්නන් වේ. එයට අකමැති වන්නේ පිරිහෙන්නන් වේ.

**2 අසත් පුරුෂයන්ට ප්‍රිය කිරීම, සත් පුරුෂයන්ට ප්‍රිය නොකිරීම අසද්ධර්මයට කැමති වීම.**

අසත් පුරුෂයන් ඔහුට ප්‍රිය වෙති. හේ බුද්ධාදි සත් පුරුෂයන් කෙරෙහි ප්‍රිය නොකරන්නේය. අසත්පුරුෂයන්ගේ ධර්මයට කැමති වෙයි. මේ තුන පිරිහීමට හේතු වේ.

**3 නිදන සුළු බව, දොඩවන සුළු බව, වීර්යය නැති බව, මැළි බව කිපෙන සුළු බව**

යම් කෙනෙක් නිදන සුළු ද, දොඩවන සුළු ද, නැගී සිටින්නා සුළු නොවේ ද, අලස ද, ක්‍රෝධයම ඇත්තේ ද, යන මේ පස පිරිහීමට හේතු වේ.

**4 මවු පියන් පෝෂණය නොකිරීම.**

යමෙක් තෙමේ පොහොසත් වූයේ මහළු විය ඉක්මවී ගිය යොවුන් විය ඇති මෑණියන් ද, පියාණන් ද, පෝෂණය නොකරේ ද, එය පිරිහීමට හේතු වේ.

**5 වංචාව**

යම් කෙනෙක් බ්‍රාහ්මණයකු ශ්‍රමණයකු හෝ යාචකයකු බොරු කීමෙන් වංචා කළේ ද, එය පිරිහීමට හේතු වේ.

**6 රස භොජුන් තනිව වැළඳීම**

බොහෝ රන් රිදී මුතු මැණික් ද, කහවනු සහිත වූයේ ද, නොයෙක් සූප ව්‍යඤ්ජනයෙන් යුත් භොජුන් ඇති පුරුෂයෙක් තෙමේ මියුරු රස ඇති භෝජන තනිව අනුභව කළේ ද, එය පිරිහීමට හේතු වේ.

**7 උඩගුව නෑයන් පහත් කොට සැලකීම**

යම් කෙනෙක් ජාතිය හේතු කොට ගෙන තද මන් ඇත්තේ ද, ධනය කරණකොට ගෙන තද මන් ඇත්තේ ද, සිය නෑයන් පහත් කොට සිතා ද, එය පිරිහීමට හේතු වේ.

**8 ස්ත්‍රී ලොල් බව, සුරා ලොල් බව, දූ කෙළියෙහි ලොල් බව හා ලද දෑ විනාශ කිරීම.**

යම් අයෙක් ස්ත්‍රී කෙරෙහි ලොල් වූවේ ද, රා බීමෙහි ලොල් වූවේ ද, දූ කෙළියෙහි ලොල් වූවේ ද, ලද දෑ විනාශ කිරීම යන දේ පිරිහීමට හේතු වේ.

**9 වෛශ්‍ය සේවනය, පරදාර සේවනය**

තමාගේ භාර්යාවගෙන් නොසතුටු වූ යමෙක් වෛශ්‍යාවන් කෙරෙහි ලොල් වූයේ ද, පර ස්ත්‍රීන් කෙරෙහි අසාවක් ඇති කර ගත්තේ ද, මෙ දෙදෙනා පිරිහීමේ දොරටු වේ.

**10 මහලු වියේ සිට තරුණියක සරණපාවා ගැනීම.**

තුරුණුවිය ඉක්මවා ගිය අසූ අනූ වියැති පුද්ගලයෙක් තිඹිරිඑල වැනි තන ඇති ළැදැරියක ගෙන ඇයට ඊෂ්‍යාවෙන් නොනිදා සිටීම පිරිහීමට හේතු වේ.

**11 අරපරෙස්සමක් නැති ස්ත්‍රියක හෝ පුරුෂයකු ප්‍රධානත්වයෙන් තැබීම**

මත්ස්‍ය මාංශ සුරාවෙහි ලොල් වූ ඒ සඳහා ධනය පස් මෙන් විසුරුවා නස්නා සුළු ස්ත්‍රියක් හො එබදු පුරුෂයකු ගෙදර හෝ කර්මාන්තාදියෙහි හෝ වෙළඳාම් ආදියෙහි හෝ ධනයෙහි පරිස්සමට තබා තිබීම පිරිහීමට හේතු වේ.

**12 වස්තුවෙන් අඩු වූ තෘෂ්ණාවෙන් වැඩි වූ ක්ෂත්‍රිය කුලයේ උපන්නකු රාජ්‍ය පැතීම.**

ස්වල්ප වූ වස්තුව ඇති මහා තෘෂ්ණාවෙන් වූ යමෙක් ක්ෂත්‍රිය කුලයේ ඉපිද රාජ්‍ය පාලනය කිරීම පිරිහීමට හේතු වේ.



*උපුටාගැනීම :*

නාරද මාහිමියන්ගේ ධර්ම සංග්‍රහය ග්‍රන්ථයේ 29 වන පරිච්ඡේදය

*සටහන*

සෙ/319573 කෝප්‍රල් තරංග බීඑම්ඩී 10 ශ්‍රීලපාහ

## 9 (සෙව්) ශ්‍රීලපාහ පුවත්



# "මව් පදවිය ලොවේ අන් පදවියකට සමාන කළ හැකිද ?"

වයස අවුරුදු 82 ක්වූ ඩේවිඩ් ෂෙල්ටන් පියාණන් හා වයස අවුරුදු 75 ක් වූ කිරි එතනා මැණියන් ජීවත්වූයේ 138, ඇහැටුගස්වැව, කිරිඉබ්බන්වැව ප්‍රදේශයේ කුඩා පැල්පතකය. මොවුන් මෙම ප්‍රදේශයට පදිංචියට පැමිණ ඇත්තේ 1984 වර්ෂයේය. මොවුන් ඉතාමත් අසරණව ජීවත් වන බව ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් ජීඒබීවීටීජී විජේගුණවර්ධන ආර්එස්පී ශ්‍රීලපාහ වෙත වැලිඔය ප්‍රාදේශිය ලේකම්වරයා මඟින් දැනගන්නට ලැබුණි. ඒ අනුව 62 වන සේනාංකාධිපති බ්‍රිගේඩියර් කේජී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී අයිජී ගේ උපදෙස් මත සහ වැලිඔය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ද්‍රව්‍යමය ආධාර මත ඒකක සෙබළුන්ගේ ශ්‍රම දායකත්වයෙන් නව නිවසක් ඉදිකිරීම සඳහා අත්තිවාරම දමන ලදී. මෙම නිවසේ වයෝවෘද්ධ මැණියන් අසනිපව එක්තැන්වී ඉතාමත් ජරාජීර්නව සිටින්නීය. මෙම දෙපලට වයස අවුරුදු 40 ක හා 30 ක පුතුන් දෙදෙනෙක් ද සිටින බවත්, ඔවුන් මෙම දෙමාපියන් ගැන සොයා බලන්නේ නැති බවත්, අසල්වැසි වැසියන්ගෙන් දැනගන්නට ලැබිණි.

අණදෙන නිලධාරීගේ උපදෙස් පරිදි ක්‍රියාත්මකවු අප ඒකකයේ නිලධාරීන් හා සෙසුනිලයින් එක්ව එම මව්පියන් දෙපළ වතුර උණුකර නහවා අලුත් ඇඳුම් අන්දවා ඇඳක් මත මෙට්ට සහ ඇඳ ඇතිරිලි අතුරා, කෙසෙල්, තැඹිලි හා කිරි ආදිය කවා පොවා ශ්‍රී උදුම්බරාරාම විහාරස්ථානයේ විහාරධිපති පූජ්‍ය රණවක ධම්මින්ද ස්වාමීන් වහන්සේ එම ස්ථානයට වැඩම කරවා සෙත්පිරිත් සජ්ඣායනාවක්ද පවත්වා ඔවුන් සිටි පැල්පත සම්පූර්ණයෙන් ගලවා නව නිවස ඉදිකර දෙන තුරු සිටීමට තාවකාලික නිවසක් ඉදිකර දෙන ලදී.



## සෙබළ හිසට සෙවනක්



13 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් සෙ/13කිවූ00129 සාසෙ දිසානායක ඩීඑඩීඒඩබ් යන සෙනියා දියණියන් පස්දෙනෙකුගේ හා පුතණුවන් දෙදෙනෙකුගේ පියෙකු වේ. බිරිඳ සිම්ති ප්‍රියදර්ශනි වන අතර, දරුවන් හත්දෙනාගෙන් එක් දියණියක් මීට පෙර මියගොස් ඇත. මෙම සෙබළා ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් පීඒබීඑම්ජී විජේගුණවර්ධන ආර්එස්පී ශ්‍රීලපාහ හමුවී දරුවන් සමඟ ජීවත් වීමට නිවසක් නොමැති බවත් නුවර ප්‍රදේශයෙන් ඉඩම් කොටසක් ලබාදෙන ලෙසත් ඉල්ලීමක් කර ඇත.

මේ පිළිබඳව සොයා බැලූ අණ දෙන නිලධාරි 62 වන සේනාංකාධිපති බ්‍රිගේඩියර් කේජීඩී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී අයිජී ගේ උපදෙස් මත වැලිඔය මහවැලි අධිකාරි කාර්යාලයෙ සහයෝගයෙන් නුවර රෝහලට ආසන්නයෙන් නිවස සෑදීම සඳහා ඉඩම් කොටසක් ලබාදෙන ලදී. පසුව නිවස සෑදීමේ කටයුතු සිදු කරන අතර, ඒ සඳහා ඉසේරෙ ශ්‍රම දායකත්වය ලබාදෙමින් ඒකක අණදෙන නිලධාරි විසින් වැඩ කටයුතුවල විධිමත්භාවය සොයා බලනු ලබයි. මෙම සත් ක්‍රියාවට මුල්තැන දෙමින් කටයුතු කළ අණදෙන නිලධාරිටත්, සෙසුනිලයින්ටත්, තවත් මෙවන් වූ සත් ක්‍රියාවන් සිදු කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රර්ථනා කරමු.

## පාබල සෙබලෙකුගේ මනුෂ්‍යත්වය



සෙ/9ඩී00188 කෝප්‍රල් මුතුබණ්ඩා ආර්ඒටී යන කොනොනි හට අනුරාධපුර වෙළඳ සංකීර්ණය අසල රුපියල් 9500.00 ක් වටිනා සැම්සුන් වර්ගයේ ජංගම දුරකථනයක් බිමවැටී තිබී හමුවී ඇත. පසුව මෙම කොනොනි දුරකථනයේ තිබූ අංකයට ඇමතුමක් ලබාදී අංක 250බී, යාය, පදවි, පරාක්‍රමපුර එස්ඒටී විමුක්ති යන අයගේ බව තහවුරු කරගන්නා ලදී. දුරකථනය තමාට හමුවු බවත් දුරකථනය ලබා ගැනීම සඳහා කඳවුර වෙත පැමිණෙන ලෙස අයිතිකරුට දන්වා සිටියේය. මේ පිළිබඳ විස්තර තම අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් පීඒබීඒටීපී විජේගුණවර්ධන ආර්එස්පී ශ්‍රීලපාහ හට පවසා ඔහුගේ ද උපදෙස් අනුව දුරකථනය හිමිකරුගේ පියා එස්ඒටී නිමල් රාජපක්ෂ මහතා වෙත 2015.03.17 වන දින භාරදෙන ලදී. මෙම කොනොනිවරයා කළ උදාර ක්‍රියාව අප කාටත් ආදර්ශයක් වනු ඇත.

## වෙසක් සිරියේ ආමිෂ පූජාවෙන් කුසට අතරක් සැලූ

## ශ්‍රීලපාහ සේවාවනිතා ශාඛාවේ

# මඤ්ඤොක්කා දන්සල



2015.05.02 දින සුපුරුදු පරිදි සම්බුදු තෙමඟුල් අසිරිය නිමිත්තෙන් ශ්‍රීලපාහ සේවාවනිතා ශාඛාවේ මඤ්ඤොක්කා දන්සලක් පැවැත්වීම මෙවරද සිදු විය. එම ශාඛාවේ ගරු සභාපතිනිය ධනංජනි කරුණාසේකර මැතිණියගේ මගපෙන්වීමෙන් හා එම කාර්යය මණ්ඩලයේ අධීක්ෂණයෙන් එම සත් ක්‍රියාව සාර්ථක කරගැනීමට හැකි විය.

මෙහිදී විශාල බැතිමතුන් පිරිසක් එහි රසය විඳගෙන තම කුසගිනි නිවාගත් අතර, මෙම උතුම් සත් ක්‍රියාවට දායකවූ සියලුම දෙනාට තවත් මෙවන් උතුම් කටයුතු සිදු කිරීමට ශක්තිය හා ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.



## සේවාවනිතා විශේෂ ධර්මදේශනා



2015 වර්ෂයේ වෙසක් පොහොය නිමිති කරගෙන ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාව වෙතින් සංවිධානය කරන ලද විශේෂ ධර්ම දේශණාව පූජ්‍ය බොරැල්ලේ කෝවිත ස්වාමින් වහන්සේ විසින් 2015.05.18 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී පැවැත් වූ අතර, මෙම අවස්ථාවට ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති තුමන් හා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනිය ඇතුළු ජ්‍යෂ්ඨ නිලධාරීන්, සේවාවනිතා ශාඛාවට අයත් සෙසු සමාජිකාවන් හා රණවිරුවන් විශාල පිරිසක් සහභාගි වූහ.



# සේවාවනිතාවන්ගේ රණවිරු සෙවනට සරණ

ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ප්‍රජා සත්කාර යටතේ නිවාස නොමැති රණවිරුවන් වෙත නිවාස ඉදිකිරීමේ සංකල්පයේ තවත් පියවරක් ලෙසින් 2015.05.15 දින කටුගස්තොට දී සිදුකරන ලදී. 12 ශ්‍රීලපාහ ඒකකය සමගින් රාජකාරි කරමින් සිටියදී ක්‍රියාන්විතයේදී මියගිය සෙ/306454 සැරයන් දෙහිගොල්ල ඩීපීපී ගේ ළඟම ඥාතීන් වෙත නිවසක් ඉදිකර දීම සඳහා මුල්ගල තබන ලදී.

මෙම නිවස සඳහා 60% ක මූල්‍යමය දායකත්වය ශ්‍රීලපාහ සේවාවනිතා ශාඛාවෙන් ද, ඉතිරි 40% ක මූල්‍ය දායකත්වය යුද්ධ හමුදා සුබ සාධක අධ්‍යක්‍ෂක මණ්ඩලයෙන් ද, ඇතිව 12 ශ්‍රීලපාහ ශ්‍රමදායකත්වයෙන් ඉදි කිරීමට නියමිතය.



ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ප්‍රජා සත්කාර යටතේ නිවාස නොමැති රණවිරුවන් වෙත නිවාස ඉදිකිරීමේ සංකල්පයේ තවත් පියරක් ලෙසින් 2015.05.15 දින ගලගෙදර ප්‍රදේශයේ දී සිදුකරන ලදී. 17 (සේවි) ශ්‍රීලපාහ ඒකකය සමගින් රාජකාරි කරමින් සිටියදී ක්‍රියාන්විතයේදී ආබාධිත සෙ/17ඩී00162 ලාකෝ සුනිල් එස් වෙත නිවසක් ඉදිකර දීම සඳහා මුල්ගල තබන ලදී.

මෙම නිවස සඳහා 60% ක මූල්‍යමය දායකත්වය ශ්‍රීලපාහ සේවාවනිතා ශාඛාවෙන් ද, ඉතිරි 40% ක මූල්‍ය දායකත්වය යුද්ධ හමුදා සුබ සාධක අධ්‍යක්‍ෂක මණ්ඩලයෙන් ද, ඇතිව 17 (සේවි) ශ්‍රීලපාහ ශ්‍රමදායකත්වයෙන් ඉදි කිරීමට නියමිතය.





# විරුදරුවන්ට සේවාවනිතා අතහිත

ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ තවත් ප්‍රජා සත්කාරයක් 2015.06.23 දින ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී සිදු කරන ලදී.

5 වන ස්වේච්ඡා බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් සෙ/5ඩී01356 සැරයන් තිලකරත්න ජේවී යන ජ්‍යෙකොනොනිගේ ස්නායු ආබාධිත තත්ත්වයේ පසුවන දියණියට වෛද්‍ය ප්‍රතිකාර කිරීමට රුපියල් 30,000.00ක මුදල් ආධාරයක් සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනි ධනංජනි කරුණාසේකර මැතිණිය විසින් පරිත්‍යාග කළේ ය.

# THE DUKE OF CORNWALL'S LIGHT INFANTRY

The Duke of Cornwall's Light Infantry were an amalgamation of two regiments; the 32nd Foot and the 46th Foot The 32nd were raised in 1702 as a regiment of marines and were known from the name of their Colonel as 'Fox's Marines'. At that time a major part of British strategy consisted of mounting amphibious operations against Spain to destroy her naval bases, and the first action of the Regiment was against a treasure fleet from the Americas which had taken shelter in Vigo Bay. Well over a million pounds worth of silver was seized and 2000 Spaniards killed for a negligible British loss. Two years later the Regiment was part of a force which captured Gibraltar, a victory of enormous significance to Britain ever since

In 1741, new regiments were raised for the War of the Austrian Succession among which was the 57th, known as Price's Regiment and renumbered the 46th in 1748. In this war the 32nd fought at Dettingen, the last occasion at which British troops were commanded by their Sovereign in the field.Meanwhile in Canada and the West Indies, the 46th saw almost continuous action, fighting at Ticonderoga, Niagara, Quebec, Martinique, St. Lucia, Granada and St. Vincent. After a brief respite in Ireland, they returned to America to fight the rebel colonials. In 1777, the Light Company of the 46th took part in an attack against a rebel force near Paoli. In order to achieve complete surprise, all flints were removed from muskets to eliminate the chance of an accidental shot being fired. After a remarkable night approach through forest, the force attacked with the bayonet, killing or capturing over four hundred rebels. The Americans, viewing this action as an example of British barbarity, swore that no quarter would be given in future. Those who took part, determined that others should not suffer on their account, dyed their hat feathers red proclaiming that they alone were responsible. From that time the 46th wore red in their headdress.

In the long war against Napoleon in the Peninsula and France, the 32nd were involved almost continuously, winning



*The Battle of Paoli, 1777*



***McCabe's last sortie ,29th September 1857. Captain Bernard McCabe is mortally wounded leading a successful sortie against rebel guns bombarding the beseiged Residency at Lucknow***

battle honours at Rolica, Viemera, Corunna, Salamanca, Pyrenees, Nivelle, Nive, Orthes and finally Quatres Bras and Waterloo. At Waterloo, the 32nd suffered the highest casualties of any regiment, losing 685 men killed and wounded, and were singled out for particular praise by the Divisional Commander.

Again, it was the 2nd Battalion, who in 1899, went to South Africa to fight the Boers. At Paardeberg, where General Cronje and 4000 Boer commandos surrendered, the Cornwalls suffered heavily in a bayonet charge across open grassland. Of the 250 men who took part twenty eight were killed (including the Colonel and Adjutant) and fifty two wounded. One of the lasting impressions of August 1914 was the quiet, imperturbable efficiency with which the British Army mobilised. This was epitomised by the 1st Battalion, then stationed at the Curragh. The order to mobilise was received on 4th August and by the 7th they had been brought up to strength by the addition of no fewer than 650 reservists. On the 13th they sailed, and on the 23rd August were in action on the Mons-Condo Canal. The 2nd Batta lion were in Hong Kong where, as a result of the Royal Navy being short of marines, they once more reverted to the Regiment's role of 1702 and embarked in HMS Triumph to serve afloat. Soon however they too were back fighting in France. During the Great War, the DCLI raised fifteen battalions, eight of which saw action against the enemy in France, Flanders, Aden, Palestine, Salonika, Serbia and Bulgaria. The Regiment took its full share of the appalling attrition on the Western Front, being represented in every major battle of the war. Four thousand two hundred and eighty two men were killed and many times that again were wounded.

When war again broke out in 1939 the 2nd Battalion crossed to France with the BEF and in 1940 were engaged in the rearguard action and evacuation through Dunkirk. Happily most escaped to fight again in North Afhca, Italy and Greece, where they won the battle honours of Cassino and Incontra.

The 1st Battalion which was in India moved to Iraq, and then in 1942 were rushed to Libya where they were immediately thrown into battle near Tobruk. There at Bir-ei-Hamat, on the 5th and 6th June, in hastily pre pared defensive positions, they met the full force of Rommel's armour. The result was inevitable, and in a few hours the Battalion suffered so severely that it virtually ceased to exist. The 5th Battalion (TA) landed in Normandy on 23rd June 1944 and within three days *wete* engaged in the fierce fighting in the Bocage. Among heir many heroic actions, the Battle ofHilll12 (Cornwall Hill) stands out, as does the gallant dash to Nederrijn a few months later in an attempt to relieve the airborne force trapped at Arnhem. In spite of very high casualties, they maintained their Cornish identity thanks to reinforcements sent over by the other TA battali0n, 4 DCLI.

After the \far the usual cuts took their toll. The Territorials were reducefl to a single battalion and in 1950 the two regular battalions amalgamated. In 1959 the regular battalion amal gamated with that of The Somerset Light

Miles up the Nile in a forlorn attempt to relieve General Gordon at Khartoum: Again, it was the 2nd Battalion, who in 1899, went to South Africa to fight the Boers. At Paardeberg, where General Cronje and 4000 Boer commandos surrendered, the Cornwalls suffered heavily in a bayonet charge across open grassland. Of the 250 men who took part twenty eight were killed (including the Colonel and Adjutant) and fifty two wounded.

One of the lasting impressions of August 1914 was the quiet, imperturbable efficiency with which the British Army mobilised. This was epitomised by the 1st Battalion, then stationed at the Curragh. The order to mobilise was received on 4th August and by the 7th they had been brought up to strength by the addition of no fewer than 650 reservists. On the 13th they sailed, and on the 23rd August were in action on the Mons-Condo Canal. The 2nd Batta lion were in Hong Kong where, as a result of the Royal Navy being

Short of marines, they once more reverted to the Regiment's role of 1702 and embarked in HMS Triumph to serve afloat. Soon however they too were back fighting in France.During the Great War, the DCLI raised fifteen battalions, eight of which saw action against the enemy in France, Flanders, Aden, Palestine, Salonika, Serbia and Bulgaria. The Regiment took its full share of the appalling attrition on the Western Front, being represented in every major battle of the war. Four thousand two hundred and eighty two men were killed and many times that again were wounded.

When war again broke out in 1939 the 2nd Battalion crossed to France with the BEF and in 1940 were engaged in the rearguardaction and evacuation through Dunkirk. Happily most escaped to fight again in North Afhca, Italy and Greece, where they won the battle honours of Cassino and Incontra. The 1st Battalion which was in India moved to Iraq, and then in 1942 were rushed to Libya where they were immediately thrown into battle near Tobruk. There at Bir-ei-Hamat, on the 5th and 6th June, in hastily pre pared defensive positionS, they met the full force of Rommel's armour. The result was inevitable, and in a few hours the Battalion suffered so severely that it virtually ceased to exist. The 5th Battalion (TA) landed in Normandy on 23rd June 1944 and within three days *wete* engaged in the fierce fighting in the Bocage. Among heir many heroic actions, the Battle ofHilll12 (Cornwall Hill) stands out, as does the gallant dash to Nederrijn a few months later in an attempt to relieve the airborne force trapped at Arnhem. In spite of very high casualties, they maintained their Cornish identity thanks to reinforcements sent over by the other TA battali0n, 4 DCLI. After the \far the usual cuts took their toll. The Territorials were reducefl to a single battalion and in 1950 the two regular battalions amalgamated. In 1959 the regular battalion amal gamated with that of The Somerset Light Infantry to form The 1st Battalion The Somerset and Cornwall Light Infantry. The Terri torials maintained the old title up to their disbandment on 31st March 1969, and thus ended a chapter which had run for 267 years in Cornwall's history.



*The Cornwall's charge at Paardeberg*

10 ශ්‍රීලපාහ පුවත්

# සූර්ය මංගල්‍යය සමරයි



මල්ලාවි පාලිනගර් ප්‍රදේශයේ ස්ථානගත 10 ශ්‍රීලපාහ ඒකකය විසින් 2015.04.11 දින ජන ක්‍රීඩා වලට මුල් තැන දෙමින් ඒකකයේ සියලු නිලධාරි සහ සියලුම සෙනීන්ගේ හා සිවිල් සේවක මහතුන්ගේ සහභාගීත්වයෙන් ඉතා උත්කර්ෂවත් අයුරින් බක්මහ උළෙලක් පවත්වන ලදී.

සූර්ය මංගල්‍යය උදාවේදී ඒකක අණදෙන නිලධාරී නි/63373 මේජර් ටීකේඩී ධර්මසේන ආර්එස්පී ශ්‍රීලපාහ ගේ



සංකල්පයකට අනුව අවුරුදු චාරිත්‍ර චාරිත්‍ර වලට මුල් තැන දෙමින් අවුරුදු උදාවේදී කිරි උතුරවා පොල් තෙල් පහන දල්වා සියලුම අයවලුන්ගේ පූර්ණ දායකත්වයෙන් පිළියල කර තිබූ තේ පැන් සංග්‍රහයක් භුක්ති විදින ලදී. ඉන් අනතුරුව ඒකක අණදෙන නිළධාරි විසින් සියලුම නිලධාරි සහ සෙසුනිලයින්ගේ මියගිය,අබාධිත රණවිරුවන්, සිවිල් සේවක මහතුන්ගේ සහ ඔවුන්ගේ පවුල් වලටත්, එම පවුල් වල ඥාතින්ටත්, සාමය සතුට පිරි සෞභාග්‍යමත් අලුත් අවුරුද්දක් වේවායි සුබ ප්‍රාර්ථාන කරන ලදී.

# 653 බළසේනාධිපතිගේ ඒකක සංචාරය





ඒකකය සමගින් රාජකාරි කර විවිධ ස්ථානයන් වල රාජකාරියෙන් පසු 653 බළසේනාධිපති බ්‍රිගේඩියර් එම්ඩී විජේසුන්දර ආර්එස්පී ශ්‍රී ලංකා පාබල හමුදාවෙන් බිහි වූ තවත් දීප්තිමත් ජ්‍යෂ්ඨ නිලධාරියකු වේ. 57 සේනාංක මූලස්ථානයේ නියෝජ්‍ය සේනාංකාධිපති වශයෙන් පත් වී යාමට පෙර 2015.03.31 දින මෙම ඒකකයේ සංචාරයක් සිදු කරන ලදී. එහිදි අණදෙන නිලධාරි මේජර් ටීකේඩී ධර්මසේන ආර්එස්පී ශ්‍රීලපාහ විසින් එතුමන්ව පිළිගෙන කඳවුරු සම්මාන මුරයක් ද පිරිණැමීය. ඉන් පසු කඳවුරු භූමියේ අඹ පැළයක් රෝපණය කිරීමට ද අමතක නොකළේ ය. සියලුම හටපිරිස් ඇමතිමෙන් පසු තේ පැන් සංග්‍රහයක් ද පිළිගන්වන ලදී. කඳවුරු භූමියෙන් නික්ම ගිය බලසේනාධිපති තුමනි ඔබගේ කාර්යයන් සාර්ථක වේවායි අප ඔබට සුබ පතන්නෙමු.

බුද්ධි අංශය 10 ශ්‍රීලපාහ

# රෙපිමේන්තු අධිපතිගේ රෙපිමුඛ ශ්‍රීලපාහ සංචාරය

රෙපිමුඛ ශ්‍රීලපාහ

**පුවත්**



ආරක්ෂක සේනා මුලස්ථානය (බටහිර) යටතේ බූස්ස ප්‍රදේශයේ ස්ථානගතව රෙපිමුඛ ශ්‍රීලපාහ ඒකකය රාජකාරී කරනු ලබයි. 2015.04.27 දින ශ්‍රීලපාහ රෙපිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඒඩීඒ කරුණාසේකර ආර්ඩබ්ලිව්පී යූඑස්පී එන්ඩීයු පීඑස්සී සහ සේනාවිධායක බ්‍රිගේඩියර් සීඩී වීරසූරිය ආර්එස්පී ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙම ඒකකයේ සංචාරය කළහ. එහිදී ඒකකය සබැඳිව අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් ඒසීජේ වාසගේ ශ්‍රීලපාහ විසින් විස්තරාත්මකව පැහැදිලි කිරීමක් සිදු කරන ලදී. අනතුරුව රෙපිමේන්තු අධිපති විසින් ඒකක භටපිරිස් ඇමතූ අතර, එහිදී සියලු නිලයින්ගේ ගැටළුකාරී තත්ත්වයන් පිළිබඳව අඩුපාඩු සොයා බලා එම ගැටළු නිරාකරණය කර ගැනිමට ඉදිරියේ දී හැකි සෑම පියවරක්ම ගනු ලබන බැව් සඳහන් කරන ලදී. අනතුරුව කඳවුර අවට ප්‍රදේශයේ නිරීක්ෂණ චාරිකාවක නිරතවීමෙන් පසු නික්ම යන ලදී. මෙවන් සංචාරයක නිරත වූ රෙපිමේන්තු අධිපති, සේනාවිධායක තුමන්ලා වෙත අණදෙන නිලධාරී ප්‍රමුඛ සියලු නිලයින් වෙතින් මෙසේ කෘතවේදීත්වය පුදකරන්නෙමු.



# සේනාවිධායක තුමන්ගේ රෙපිමුඛ ශ්‍රීලපාහ සංචාරය



බූස්ස රෙපිමුඛ ශ්‍රීලපාහ කඳවුරට 2015.05.18 දින රෙම ශ්‍රීලපාහ සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්එස්පී සංචාරයක් සිදු කළේ ය. මෙහිදී ඒකකයේ පිහිටීම හා කඳවුරේ දැනට පවතින තත්ත්වය  අණදෙන නිළධාරී විසින් පැහැදිලි කිරීමෙන් අනතුරුව සේනාවිධායක විසින් සියලු භටපිරිස් අමතන ලදී. එහිදී සියලු නිලයින්ගේ ගැටළුකාරී තත්ත්වයන් පිළිබඳව සාකච්ඡා කර ඉදිරියේදී එම ගැටළු නිරාකරණය කර ගැනිමට පියවර ගනු ලබන බැව් සඳහන් කළේය.

නව තනතුරෙහි වැඩ භාර ගැනීමෙන් අනතුරුව මෙම කඳවුර වෙත පැමිණි නව සේනාවිධායක තුමන් විසින් රාජකාරියේ යෙදී සිටියදී ආබාධිත තත්ත්වයට පත්ව සිටින නිලධාරී හා සෙසුනිලයින්ගේ සුවදුක් සොයා බැලීමට පැමිණීම පිළිබඳව අණදෙන නිලධාරී ප්‍රමුඛ සියලුම නිලයින් විසින් කෘතවේදීත්වය පුද කරමු.



මූලස්ථානය රෙපිමුඛ ශ්‍රීලපාහ  බූස්ස

# ALMOND TENT

15 ශ්‍රීලපාහ /// පුවත්

## නව නිලධාරි නිවස්නය



15 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරීගේ මඟ පෙන්වීමෙන් හා සියලු නිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් නිලධාරි නිවස්නයට නව ගොඩනැගිල්ලක් ඉදි කරන ලදී.

ඒකකය වෙත පැමිණෙන ආගන්තුක නිලධාරින්ගේ ප්‍රයෝජනය සඳහා සියලු පහසුකම් වලින් යුක්තව අභිනවයෙන් ඉදිකරන ලද "ALMOND TENT" නිලධාරී නිවස්න ගොඩනැගිල්ල 2015 අප්‍රේල් මස 16 වන දින අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් එන්පීකේ ගුණසේන ශ්‍රීලපාහගේ සුරතින් විවෘත කරන ලදී.





## සූර්ය මංගල්‍යයේ ඇරැඹුම

15 වන පාබල හමුදා බළඇණිය 2015 සිංහල අලුත් අවුරුදු උළෙල ඉතාමත් උත්කර්ෂවත් අයුරින් සැමරීමට අණදෙන නිලධාරී ඇතුලු සියලුම නිලයින් කටයුතු කළහ. 2015.04.12 වන දින නව අවුරුදු උදාවත් සමඟ සාම්ප්‍රදානුකූලව ආගමික වතාවත් සිදු කොට ඒකක නිලධාරී හා සෙසුනලයින් විසින් තිස්සපුර ශ්‍රී අග්බෝ පුරාණ රජ මහා විහාරයේ බෝධිපූජා පිංකමක් පවත්වා ආශිර්වාද ලබාගැනීමෙන් පසු බළඇණි මූලස්ථානයෙහි කිරි ඉතිරවීම සිදු කරන ලදී. පසු දින දෙවන අණදෙන නිලධාරී විසින් සියලුම කණ්ඩායම් මූලස්ථානයන් වෙත ගොස් සහෝදර සෙබළුන් වෙත සිය අවුරුදු පණිවුඩය දැනුම් දී ඔවුන් සමඟ අවුරුදු උදාවේ සතුට සොම්නස බෙදාගන්නා ලදී.

2015.04.16 වන දින දවස පුරා බළඇණි මූලස්ථාන කඳවුරු ක්‍රීඩා භූමිය වර්ණවත් කරමින් බළඇණි අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් එන්පීකේ ගුණසේන ශ්‍රීලපාහ ගේ ප්‍රධානත්වයෙන් හා සියලුම නිලයින්ගේ සහභාගිත්වයෙන් අලුත් අවුරුදු උත්සවයක් සංවිධානය කෙරුණි. එහිදී පැරණි සංස්කෘතික අංග ඇතුළත් අවුරුදු ක්‍රීඩා රැසක් පැවැත් වූ අතර, ඒකකයේ නිලධාරී සහ සෙසුනිලයින් මෙන්ම සිවිල් සේවක මහතුන් මේ සඳහා සහභාගී වූහ.

තවද, තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ නෙස්ලේ ලංකා සමාගම සමඟින් අත්වැල් බැඳ ගනිමින් 2015.04.25 දින එම ප්‍රදේශයේ දැවැන්ත අලුත් අවුරුදු උළෙලක් පැවැත් වූ අතර, ඒකක සෙබළුන්ගේ පූර්ණ ශ්‍රම



දායකත්වය ඒ සඳහා ලබාදීමට අණදෙන නිලධාරී විසින් උපදෙස් ලබාදීමෙන් එම කාර්යය සාර්ථක කරගැනීමට හැකිවීය.






# උපන් දින සුභ පැතුම්





2015 ජූනි මස 10 වන දින
පළමු උපන්දිනය සමරන
12 බලඇණියේ සෙ/310003 කෝප්‍රල් රංජිත් S RSP ගේ
ආදරණීය දියණිය
දේශානි විහංගා සමරවික්‍රම



2015 මාර්තු මස 30 වන දින
දෙවන උපන්දිනය සමරන
11 බලඇණියේ සෙ/317147 කෝප්‍රල් පුෂ්පකුමාර MW ගේ
ආදරණීය දියණිය
පංචලී බිමංසා



2015 අප්‍රේල් මස 19 වන දින
තුන්වන උපන්දිනය සමරන
19 බලඇණියේ සෙ/318466 සැරයන් ඉන්ද්‍රලාල් WMA ගේ
ආදරණීය පුතණුවන්
ධනුජ නෙතමිණ විජේරත්න



2015 අප්‍රේල් මස 27 වන දින
හයවැනි උපන්දිනය සමරන
23 බලඇණියේ සෙ/311749 වසි II විජේසිංහ WMG ගේ
ආදරණීය පුතණුවන්
අයෂාන් ඉඳුවර අයුස්මන්ත



2015 මැයි මස 06 වන දින
පළමු උපන්දිනය සමරන
7 බලඇණියේ සෙ/318485 කෝප්‍රල් සිසිර LPS RSP ගේ
ආදරණීය දියණිය
විහාසි නිදර්ශනා ගිත්සරී



2015 පෙබරවාරි මස 14 වන දින
පළමු උපන්දිනය සමරන
7 බලඇණියේ සෙ/325277 ලාන්ස් වීරකෝන් A ගේ
ආදරණීය පුතණුවන්
ශනෙත අනුර වීරකෝන්



2015 ජූනි මස 23 වන දින
උපන්දිනය සමරන
සෙ/00332 ලාන්ස් අත්තනායක AYSAK
ගේ ආදරණීය දියණිය
සසුරි උපේක්ෂා අත්තනායක



2015 ජූලි මස 29 වන දින
තුන්වන උපන්දිනය සමරන
සෙ/320150 කෝප්‍රල් පුෂ්ප කුමාර KMI ගේ
ආදරණීය දියණියන් දෙදෙනා
හර්ෂනී කාවින්දියා
හාසිනි කාවින්දිය



2015 මාර්තු මස 24 වන දින
උපන්දිනය සමරන
10 බලඇණියේ සෙ/318558 සැරයන් වීරසිංහ WMHJ ගේ
ආදරණීය පුතණුවන්
නෙතුල් තේසර වීරසිංහ



2015 ජූනි මස 02 වන දින
උපන්දිනය සමරන
රෙජිමේන්තු බලඇණියේ සෙ/316150 කෝප්‍රල් ගුණතිලක GR ගේ
ආදරණීය පුත්
උදීෂ නදුන් බිම්සර



2015 අප්‍රේල් මස 17 වන දින
උපන්දිනය සමරන
10 බලඇණියේ සෙ/319103 කෝප්‍රල් කුමාර YBN ගේ
ආදරණීය පුත්
තුෂාර



2015 මැයි 10,11 දිනයන් හිදී
උපන්දිනය සමරන
1 බලඇණියේ සෙ/311054 වසි II දිලුක BGD RSP ගේ
ආදරණීය දියණියන් දෙදෙනා
බීජී තුෂාරංගි කෞෂල්‍යා
බීජී හාසිකා නිලක්ෂි කෞෂල්‍යා



# බක්මහේ අසිරිය විඳි රෙජි ශ්‍රීලපාහ

සිංහල හින්දු නව අවුරුදු උදාව
සාමය සතුට සම්පත පිරි දයාව
ලක්වැසි දනන්ගේ මුහුණේ සිනාව
පාබල පුතුන් විඳගයි එය මනාව

කොවුල් නදින් පැමිණෙනවා අවුරුද්ද
එරබදු මල් පිපි සුවඳයි ගම් මැද්ද
නෑගම් යන්න සැරසෙනවා ගැමියන්ද
පාබල පුතුන් සමරයි නව අවුරුද්ද

සාමය සතුට පිරි සිංහල අවුරුද්ද
සාමය සතුට නැති කෙරුවේ කවුරුන්ද
තිස් වසරක් පුරා ඇසුනා වෙඩි සද්ද
නැතිවිය විරුවන්ට වෙන්නට පිං සිද්ධ

සංකල්පනාව
සැරයන් සංජීව ඩබ්ලිව්පීශු වයිටිහැකාල් ප්‍රකාශන අංශය ශ්‍රීලපාහ





ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානය සිංහල හා හින්දු අලුත් අවුරුදු අසිරිය විඳින්නට 2015 අප්‍රේල් මස 09 දින කටයුතු කරන ලදී. ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායකගේ උපදෙස් හා අධීක්‍ෂණයෙන් සිදු කළ මෙම උත්සවය පනාගොඩ යුද හමුදා ජනපද ක්‍රීඩා භූමියේදී සිදු කරන ලදී. ශ්‍රීලපාහ රෙජිමේන්තු බක්මහ උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙසින් රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඒඩීඒ කරුණාසේකර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී හා ශ්‍රීලපාහ සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනිය ධනංජනී කරුණාසේකර මැතිණිය සහභාගි වූහ. එම අවස්ථාවට ශ්‍රීලපාහ කාරක සභා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇතුලු ශ්‍රීලපාහ නිලධාරීන් හා සෙසුනිලයින් ද, ඔවුන්ගේ පවුල්වල සමාජිකයින් විශාල පිරිසක් සහභාගි වූහ. සිංහල ගැමිකම් පිළිබිඹු වන අයුරින් අවුරුදු ක්‍රීඩා රාශියකින් සමන්විත විය.












# පාබල රෙජිමේන්තුවේ
## අණදෙන නිලධාරි වරුන්ගේ වාර්ෂික සාකච්ඡාව





පාබල රෙජිමේන්තුවේ වාර්ෂික අණදෙන නිලධාරී වරුන්ගේ සාකච්ඡාව යනු හුදෙක්ම වචනයට පමණක් සීමා වූ එකක් නොවේ එය හුදෙක්ම පාබල රෙජිමේන්තුවේ උන්නතිය වෙනුවෙන් ඉතාමත් සුවිශේෂී තීන්දු තීරණ ගෙන ක්‍රියාවට නැංවීමේ ක්‍රමවේදය පිළිබඳ සාකච්ඡා කෙරෙන සම්මන්ත්‍රණයයි.

2015 වර්ෂයේ මෙම සාකච්ජාව ඉතාමත් වැදගත් සංදිස්ථානයක් වනුයේ මෙවර එය රෙජිමේන්තු මධ්‍යස්ථානයෙන් බැහැරව ප්‍රථම වතාවට බළඇණියක පැවැත්වීමයි. සේනාවිධායක තුමන්ගේ උපදෙස් පරිදි 7 වන ශ්‍රීලංකා පාබල හමුදාව තුළ පැවැත්වීමට කටයුතු සිදු කෙරිණි. මෙම අභියෝගය භාරගත් අප ඒකකයේ අණදෙන නිලධාරී නි/63017 ලුතිතන් කර්නල් එම්පීඑස්පී කුලසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහගේ උපදෙස් පරිදි දෙවන අණදෙන නිලධාරි නි/63754 මේජර් එච්ඒඩීවීකේ ඇලෙක්සැන්ඩර් ඩබ්ලිව්ඩබ්ලිව්වී ශ්‍රීලපාහ ඇතුලු ඒකකයේ සියලුම නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ එකමුතුවෙන් හා මනා කැපවීමෙන් මෙම හමුව සඳහා අවැසි සියලු කටයුතු සූදානම් විය.

2015.04.30 දින රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් සීඩී වීරසූරිය ආර්එස්පී පැමිණි අතර, එහිදී කඳවුරු සම්මාන මුරයක් පිරිනමන ලදී. ඉන් අනතුරුව කඳවුරු භූමියේ අඹ පැළයක් රෝපණය කිරීමෙන් පසුව සේනාවිධායක ඇතුලු මාණ්ඩලික නිලධාරින් හා ඒකක අණදෙන නිලධාරීවරුන් 24 දෙනෙකුගේ සහභාගිත්වයෙන් සාකච්ජාව ආරම්භ කෙරිණි.

මෙම සාකච්ජාව සාර්ථකව පැවැත්වීමට 7 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරි, නිලධාරින් සහ සෙසුනිලයින් දැක්වූ සහයෝගය පැසසුමට ලක්කර සාකච්ජාවෙහි නිමාව සටහන් කළ සේනාවිධායක ඇතුලු සියලුම අණදෙන නිලධාරීවරුන් කඳවුරෙන් නික්ම ගියහ.

## රෙජිමේන්තු අධිපතිගේ සුරතින් විවෘත වූ 7 ශ්‍රීලපාහ කොනොනි සමාජ ශාලාව







7 ශ්‍රීලපාහ ඒකකයේ සෙසුනිලයින් සඳහා අඩු පාඩුවක් පැවැති කොනොනි සමාජ ශාලාවක් හා සෙසුනිල භෝජනාගාරයක් ඉදිකිරීමට ඒකක අණදෙන නිලධාරී නි/63017 ලුතිතන් කර්නල් එම්පීඑස්පී කුලසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ගේ උපදෙස් පරිදි කටයුතු කරන ලදී. සියලුම දෙනාගේ ශ්‍රම දායකත්වයෙන් 2014 සැප්තැම්බර් මස 20 වන දින ඉදිකිරීම් ආරම්භ කරන ලද මෙම භෝජනාගාර නව ගොඩනැගිල්ල 2015 මැයි මස 10 වන දින වන විට වායු සමීකරණය කරන ලද අංග සම්පූර්ණ ගොඩනැගිල්ලක් ලෙසින් දිස් විය.

සියලුම පහසුකම් සහිතව ඉදි කිරීම් නිම කරන ලද මෙම කොනොනි සමාජ ශාලාව හා සෙසුනිල භෝජනාගාර ගොඩනැගිල්ල අණදෙන නිලධාරීගේ ගෞරවනීය ආරාධනයට අනුව පැමිණි රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේඑඩීඒ කරුණාසේකර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී විසින් 2015 මැයි මස 11 වන දින යෙදුනු සුබ මොහොතින් පිරිත් සජ්ජායනාව මධ්‍යයේ විවෘත කරන ලදී. දහසකකුත් වැඩ රාජකාරී මධ්‍යයේ වුවද ගොඩනැගිල්ල විවෘත කිරීමට ආරාධනය නිහතමානිව පිළිගෙන පැමිණි රෙජිමේන්තු අධිපති තුමන් වෙත අණදෙන නිලධාරී ඇතුලු සියලුම අයවලුන්ගේ ගෞරව පූර්ව ස්තූතිය පුද කර සිටින්නෙමු.

බුද්ධි අංශය 7 ශ්‍රීලපාහ



# රණවිරු බිරිඳට පිළිසරණ



මාගේ බිරිඳ අංශභාග රෝගයෙන් පෙළී එක්තැන් වූ පසු ඇයගේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා රුපියල් 50,000.00 ක මූල්‍යමය අතහිත ලබාදීමට කටයුතු කළ ශ්‍රීලපාහ සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනිය ධනංජනී කරුණාසේකර මැතිණිය ඇතුලු එම ශාඛාවේ සාමාජිකාවන් හටත්, රුපියල් 40,000.00 ක මුදලක් ලබාදුන් 7 වන බළඇණියේ අණදෙන නිලධාරි නි/63017 ලුතිතන් කර්නල් එම්පීඑස්පී කුලසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ තුමන්ටත්, ඔබ විසින් සිදු කළා වූ මෙම මහඟු පුණ්‍යකර්මය වෙනුවෙන් මාගේ හදපිරි ස්තූතිය හා ගෞරවය පුද කරමි.

එමෙන්ම මාගේ බිරිඳට වෛද්‍ය ප්‍රතිකාර කිරීම සඳහා රැගෙන යාමට මුදලින් රුපියල් 29,000.00 ක් පමණ වටිනා රෝද පුටුවක් පරිත්‍යාග කළ 57 සේනාංකයේ සිවිල් සම්බන්ධීකරණ නිලධාරි නි/2842 කර්නල් එල්බීඩීඑච්එස් ලක්ෂ්මන් තුමන් වෙතද මාගේ කෘතඥතාවය පුද කරමි.

එක්තැන් වී සිටින මාගේ බිරිඳ දෙපයින් නැගී සිටීමට මෙවැනි උපකාර කළ ඔබ සියලුම දෙනා විසින් සිදු කළාවූ පුණ්‍යකර්මයේ බලමහිමයෙන් ඔබ සැමගේ සහ පවුලේ සියලුම දෙනාටත් විසින් කරන්නා වූ සියලුම කාර්යයන් සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවා යි මා සහ මාගේ දරුවන් විසින් උළේ හවා ප්‍රාර්ථනා කරන්නෙමු.

සෙ/303060 කෝප්‍රල් මැයිවත්ත පීපීඑච්කේ 7 ශ්‍රීලපාහ

## ආසේමු (කිලි) හි පැවති පාපන්දු තරඟාවලියේ

# ශූරතාවය දිනාගත් 20 ශ්‍රීලපාහ

20 ශ්‍රීලපාහ පුවත්

ආසේමු (කිලි) ආඥාපති තුමාගේ සංකල්පයක් මත පවත්වන ලද ජවන පිටිය හා කණ්ඩායම් ක්‍රීඩා තරඟාවලිය සඳහා ආසේමු (කිලි) බලප්‍රදේශයේ සේනාංක, බලසේනාවන්ට අයත් ඒකක 39 ක් සහභාගිවන ලදී.

මෙම තරඟාවලියේදි ඒකක 39ක් අතුරෙන් 20 ශ්‍රීලපාහ පාපන්දු කණ්ඩායම පිරිපුන් දක්ෂතා පිළබිඹු කරමින් ආසේමු (කිලි) බළප්‍රදේශයේ ශූරතාවය දිනාගනිමින් තම ඒකකයට හා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවටත් විශාල කීර්තියක් හිමිකර දීමට සමත් විය.

එම ජයග්‍රහනය සඳහා ක්‍රියාශිලිව සමගියෙන් ක්‍රීඩා කළ ක්‍රීඩකයින්ටත් එම ජයග්‍රහනය සඳහා නිවැරදි නායකත්වය හා මග පෙන්වීම සිදු කළ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් අයිපී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එසපී ශ්‍රීලපාහ දෙවන අණදෙන නිලධාරි බීපීපී රාජපක්ෂ ශ්‍රීලපාහ ඇතුලු සියලුම නිලධාරින් හා රෙජිමේන්තු සැරයන් මේජර් ඇතුලු සියලුම අයවලුන්ටත් කෘතවේදීත්වය පිරිනමමි.



බුද්ධි අංශය 20 ශ්‍රීලපාහ

# 12 ශ්‍රීලපාහ පුවත්

## රෙජිමේන්තු අධිපති තුමන්ගේ 12 ශ්‍රීලපාහ සංචාරය



2015 මාර්තු මස 05 දින රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඒඩීඒ කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී 12 ශ්‍රීලපාහ ඒකකයට පැමිණෙන ලදී. පසු දින ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් ඩීඑස්වස් රදලගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ විසින් ඒකකයේ රාජකාරි පිළිබඳව විස්තර ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඒකකය බළඇණි පුහුණුවීම් සිදු කරන ලද 59 බසේමු බලඇණි පුහුණු පාසල අලම්පිල් වෙත පැමිණීමේදී ඒකක භටපිරිස් විසින් කඳවුරු සම්මාන මුරයක් පිරිනමන ලදී. ඉන් පසු රෙජිමේන්තු අධිපතිතුමා භටපිරිස් අමතා ඒකක සංචාරය අවසන් කර නික්ම යන ලදී.








## බළඇණි පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කරයි...




12 ශ්‍රීලපාහ ඒකකය මුලතිව් ප්‍රදේශයේ ස්ථානගතව 2015.02.03 දින 59 සේමු බළඇණි පුහුණු පාසල අලම්පිල් හිදී බළඇණි සාමුහික පුහුණුව ආරම්භ කරන ලදී. එහිදී ආරම්භක දේශනය 59 සේනාංකාධිපති බ්‍රිගේඩියර් එන්ඒපීසී නාපාගොඩ යූඑස්පී අයිජී විසින් පැවත් වු අතර, නිලධාරීන් 10 ක් හා සෙසුනිලයින් 265 ක් සහභාගි වූහ.

පුහුණුවීම් අතරතුර, අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් ඩීඑස්වස් රදලගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ සමගින් භටපිරිස් අනුරාධපුරය රුවන්වැලි මහා සෑ රදුන් වැඳපුදා ගත් අතර, යාපනය ප්‍රදේශයේ අධ්‍යාපන චාරිකාවකටද සහභාගී විය. පුහුණුවීම් පිළිබඳ සොයා බැලීම සඳහා 2015.02.09 වන දින පාබලඅම අධ්‍යක්‍ෂ මේජර් ජෙනරාල් එල්ඩබ්ලිව්සීබීබී රාජගරු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එල්ඩීඑම්සී පැමිණෙන ලදි. 2015.03.13 දින පුහුණුව අවසානයේ 59 පාසේමු සේනාංකාධිපති විසින් අවසන් දේශනය ද, ඉන් අනතුරුව දක්‍ෂතා දැක්වූ අයවලුන්ට කුසලාන සහ සහතික පත් පිරිනමන ලදී.

බුද්ධි අංශය 12 ශ්‍රීලපාහ

# 6 ශ්‍රීලපාහ පුවත්

## අවුරුදු සිරිය සැමරූ 6 ශ්‍රීලපාහ





සිංහල හා හින්දු අලුත් අවුරුද්ද 6 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරි ඇතුලු අනෙකුත් නිලධාරීන් හා සෙසුනිලයින් ඉතා උත්කර්ෂවත් අන්දමින් සමරන ලදී.

මේ අනුව 2015.04.10 සහ 11 යන දිනයන් තුළදී විශ්‍රාමලත් හිටපු යුද්ධ හමුදාධිපති ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියු පීඑස්සී අභියෝගතා කුසලාන අන්තර් කණ්ඩායම් ක්‍රිකට් තරඟාවලියක් පවත්වන ලදී. එහිදී සියලු කණ්ඩායම් අභිබවා අණ හා පාලන කණ්ඩායම කුසලානය හිමිකර ගැනීමට සමත් විය. එහි අනුශූරතාවය සී කණ්ඩායමට හිමි විය. ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් කේවී පුෂ්පකුමාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ ඇතුලු සියලුම නිලධාරින් සමග රෙජිමේන්තු සැරයන් මේජර් මෙම තරඟාවලියේ අධීක්ෂණ කටයුතු සිදු කරන ලදී.

# 2 ශ්‍රීලපාහ පුවත්

## 2 ශ්‍රීලපාහ මහා බත් දන්සැල

සම්බුදු තෙමඟුල සිදු වූ වෙසක් පුන් පොහෝ දිනට සමගාමීව 2 (සෙවී) ශ්‍රීලපාහ අණදෙන නිලධාරි ගේ පූර්ණ අධීක්ෂණයෙන් සහ නිලධාරි හා සෙසුනිලයින් ගේ සහයෝගයෙන් යාපනය අරාලි ප්‍රදේශයේ ප්‍රදේශවාසීන් වෙත බත් දන්සලක් පැවැත් විය.

මෙවන් මහඟු පිංකම් සිදු කිරීම තුළින් එම ප්‍රදේශයේ ජීවත් වන විවිධ ජාතීන්ට අයත් වැසියන් තුළ එකිනෙකා කෙරෙහි ඇති වන සුහදතාවය, සමගිය සහ සහයෝගය අප මව්බිමට අත්‍යාවශ්‍ය කාරණයකි. එබැවින් එවන් වූ සත් ක්‍රියාවකට දායකත්වය සැපයූ මෙම ඒකකයේ අණදෙන නිලධාරි ඇතුලු සියලුම අයවලුන්ට අපගේ කෘතඥතාවය හිමි විය යුතුමය.







# 18 (සෙවි) ශ්‍රීලපාහ පුවත්



## නික්ම යන නියමුවාණෙනි ඔබටයි මේ

## උත්තමාචාරය...

වර්ෂ 2009 ක් වූ ජනවාරි මස 01 වන දින 2(සෙවි) ශ්‍රීලපාහ පසුමුලස්ථානයේ දි ශ්‍රී ලංකා පාබල හමුදාවේ 18 වන සාමාජිකයා ලෙස ස්ථාපිත 18 (සෙවි) ශ්‍රී ලංකා පාබල හමුදාවේ ප්‍රථම අණදෙන නිලධාරී ලෙස නි/3684 මේජර් යූ වනිගසූරිය ශ්‍රීලපාහ විසින් ඒකකයේ අණදීම සිදු කරන ලදී. පසුව 2010.05.14 වන දින මෙම ඒකකයේ අණදීම නි/4121 ලුතිතන් කර්නල් ඩබ්ලිව්වයිකේ වීරසිංහ ශ්‍රීලපාහ වෙත භාරදීම් සිදු කරන ලදී. එතුමන් විසින් වසර 04 කුත් මාස 07 ක කාලසීමාවක් ඒකකයේ අණදීම සිදු කරන ලදී. අණතුරුව 2015.03.01 වන දින ඒකකයේ නව අණදෙන නිලධාරී වශයෙන් පත් වූ නි/4880 මේජර් එච්එම්පීසී හේරත් ශ්‍රීලපාහ වෙත ඒකකයේ අණදීමේ කාර්යය භාරදීම් සිදු කර නික්ම යන අණදෙන නිලධාරී හට සම්මාන පෙළපාළියක් පිළිගැන්විය. නික්ම යන අණදෙන නිළධාරී විසින් ඒකකයේ සියලුම භටපිරිස් අමතා තම රාජකාරී කාල සීමාව තුල පැවරුණු සියලුම දේ කිරීමට අවැසි සහය ලබා දීම පිළිබඳව සියලුම අයවලුන් හට ස්තූතිය පුද කරමින් නව අණදෙන නිලධාරී හටද තමාට ලබා දුන් සහයෝගය හැකි උපරිමයෙන් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී. නික්ම යන අණ දෙන නිලධාරී තුමනි ඔබට අපගේ උත්තමාචාරය...



## නි/සෙබළුන්ගේ ක්‍රීඩා කුසලතාවය වර්ධනය කිරීමට

## වොලිබෝල් සහ ශාරීරික යෝග්‍යතා වැඩමුළුවක්...

551 බලසේනා මුලස්ථාන සහ ඒකකයන් හි රාජකාරී නියුතු නිලධාරින් සහ සෙසුනිලයින්ගේ ක්‍රීඩා කුෂලතාවය වර්ධනය කිරීමටත්, එකිනෙකා අතර සාමූහික සහජීවනය ඇති ඇතිකිරීමත්, මෙන්ම නිරෝගිමත් යුද්ධ හමුදා සාමාජිකයින් බිහිකරලීමත්, යන සංකල්පය පෙරදැරිකර අති දක්‍ෂ ක්‍රීඩා කණ්ඩායමක් තෝරා ගැනීමේ අපේක්‍ෂාවෙන් 55 වන සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්කේඩී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ හා 551 වන බළසේනාධිපති කර්නල් එස්එම්එස්පීබී සමරකෝන් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ මගපෙන්වීම හා මෙම ඒකක අණදෙන නිලධාරී මේජර් එච්එම්පීසී හේරත් ශ්‍රීලපාහ ගේ සංවිධානයෙන් යුතුව ඒකක මුලස්ථානයේ දී 2015.05.22 සහ 23 දිනයන් හි වොලිබෝල් සහ ශාරීරික යෝග්‍යතා වැඩමුළුවක් පැවැත් වූහ.









# අරුත් නිරුත්

## නිවැරදි බස වහරමු

### අලුත්/අළුත්

නව යන අරුත දෙන්නට නම් ලියන්නට ඕනෑ අලුත් යනුවෙනි. "ලු" දන්තජ විය යුතු ම ය. "අළු" ඇත්තේ ලිප් බොක්කේ ය. සොහොන් පලේ ය. නැත්නම් යමක් දැවී පිලිස්සුණු තැනෙක ය. "අළුත්" කියන්නේ අළු ද (අළු හා සමඟ) යන අරුතෙනි. අළුත් ම අළුත් යන යෙදුම පුවත් පත් දැන්වීමෙක දිනපතා ම පාහේ පළ වේ. මුදල් ගෙවා පළ කරන දැන්වීම්වල වුව ද අක්ෂර වින්‍යාසය නිවැරැදි විය යුතු ය. පත්තරවලට සල්ලි ලැබුණේ වුව ද බස නැසෙන්නට දිය යුතු නො වේ.

### අභාවය

ගෞරවාර්ථයෙන් වුව භික්ෂූන් වහන්සේට ස්වර්ගස්ථ යන්න යෙදිය හැකි නො වේ. බෞද්ධයන් ද ස්වර්ගයක් ගැන කතා කරන නමුත් ඉලක්කය නිර්වාණ සම්පත්තයයි. මරණය සම්බන්ධයෙන් බෞද්ධයන් යොදන උසස් වචනය අභාවයයි. .අභාවප්‍රාප්ත වෙයි. "අභාවප්‍රාප්ත වෙති" යනු පිළිගත් උසස් යෙදුම් ය.

එහෙත් කතෝලිකයකුට, ක්‍රිස්තියානියකුට, ඉස්ලාම් භක්තිකයකුට අභාවප්‍රාප්ත වන්නට බැරි ය. ඒ අය භවයක් නොඅදහන බැවිනි. ඒ අයට වැදගත් විදියට කාලයාත්‍රා කළ හැකි ය. කාලක්‍රියා කළ හැකි ය. නැත්නම් කලුරිය කළ හැකි ය. මියයෑමක් අවසන් හුස්ම හෙළීමත් කළ හැකි ය. එසේ ම පරලෝ සැපත්වීම ද සිදු වේ. පැවැත්ම නැතිව යාම අභාවය යැයි කෙනකුට තර්ක කරනු හැකි ය. එහෙත් කිතු බැතිමතුන් අභාවය නො වැහැරීම සම්ප්‍රදාය යි.

### අතැඹුල

"එය අතැඹුලක් සේ පැහැදිලි ය" යන්න ප්‍රකට කතාවකි. යමක් හොඳට පැහැදිලි නම් මේ උපමාව කියති. "හස්තාමලකයෑ" යි කියන අතැඹුල නම් අතේ ඇති නෙල්ලි ගෙඩියයි. නෙල්ලි ගෙඩියක් අතට ගත් කල්හි එහි ඇටය දක්වා ඇතුළතක් පැහැදිලිව පෙණේ.

ග්‍රීෂ්ම සෘතුවේ දී ඉන්දියාවේ බොහෝ ප්‍රදේශවල ජනයා අත නෙල්ලි දැකිය හැකි බව එහි බොහෝ කාලයක් උගැනීමේ යෙදී සිටි පණ්ඩිත විලියම් අල්විස් මිත්‍රයා කියයි. ඔවුන් නෙල්ලි කකා යන්නේ දාහය නැති කැර ගැනීමට ය. තිබහ නැති කැර ගැනීමට ය. ජුනි ජුලි අගෝස්තු මාසවල දී ඉන්දියාවේ උතුරුකරයේ ග්‍රීෂ්මය ඉතා දරුණු ය. පිපාසයේ සීමාවක් නැත. පිපාසය සංසිඳුවා ගැනීමට බොහෝ දෙනා ගමන් යද්දී නෙල්ලි රැගෙන යති. ඒ කාලෙට බොහෝ දෙනා අත නෙල්ලි හෙවත් හස්තාමලක දක්නට ලැබේ. අතැඹුල තව ඇතැමකු ගෙන් අර්ථ කථනය වන්නේ මැණිකක් හැටියට ය. ඔවුන් කියන්නේ ඇඹුල් ආමලකී නම මිණි වෙසෙසක් බව ය.

ඩීච්ග් කාර්යකරවන මහතාගේ
අරුත් නිරුත් පොත ඇසුරින්

# EASY CASH

## ලේසියෙන් මුදල්

දැනට ක්‍රියාත්මක වන මුදල් වංචා අතර හොදම රැවටිල්ල ඊසී කෑෂ් මුදල් වංචාවයි. මෙන්න මෙහෙමයි යුද හමුදා සෙබළුන් මේ වැඩේට යොදාගන්නේ...

සර් : හලෝ පුතා මම ප්‍රසන්න සර්
ළමයා : හලෝ සර් මම සුරංග
සර් : සුරංග මම මේජර් ප්‍රසන්න
ළමයා : ආ සර් මොකක්ද පණිවිඩය
සර් : පුතා මගේ බඩියා නිවාඩු ගියා මම දැනට හදිස්සියකට වැඩකට එලියට ඇවිත් ඉන්නේ ඔයාට එන්න පුලුවන්ද එලියට
ළමයා : සර් මම එන්නම්, කොහෙටද එන්න ඕනේ
සර් : සීසීඑම්පී ගේට්ටුව ළඟට ඇවිත් කියන්න මගේ නම කියලා මම එන්න කිව්වේ කියලා එලියට යන්න ඕනේ කියන්න, නැත්නම් සීසීඑම්පී ඉන්න කෙනෙකුට ෆෝන් එක දෙන්න මම කියන්නම්
ළමයා : හා සර් මම එන්නම්
සර් : එහෙනම් පුතා ඉක්මනට එන්න
ළමයා : හලෝ සර් මම එළියට ඇවිත් ඉන්නේ
සර් : ඔයා ඉක්මනට හෝමාගම ඊසී කෑෂ් කරන්න පුලුවන් තැනකට ඉක්මනට එන්න
ළමයා : සර් මම ඊසී කෑෂ් කරන තැනකට ඇවිත් ඉන්නේ මොකක්ද මම කරන්න ඕනේ
සර් : ඔයා ළඟ තියනවනම් මට රුපියල් 1000.00ක් ඊසී කෑෂ් කරන්න මම ඔයාට ඇවිත් දෙන්නම්
ළමයා : මා ළඟ එච්චර මුදලක් නම් නැ සර්
සර් : එහෙනම් පුතා ඔතන ඉන්න අයෙකුට ෆෝන් එක දෙන්න මම එයාට කියන්නම් විස්තරය
ළමයා : මිස් මේ අපේ සර් කෙනෙක් කථා කරනවා
මිස් : හලෝ කවුද
සර් : හලෝ මම මේජර් ප්‍රසන්න මට ලොකු හදිසියකට රුපියල් 1000.00ක් ඊසී කෑෂ් කරන්න ඕනේ මම ඇවිත් දෙන කම් කරගන්න පුලුවන්ද මම එනකල් මගේ ළමයා ඔතන ඉන්නව මම ඉක්මනට එන්නම්
මිස් : හරි සර් මම ළමයට ෆෝන් එක දෙන්නම්
ළමයා : හලෝ සර්
සර් : පුතා ඒ මිස් රුපියල් 1000.00ක් දැන් දායි මම එන කල් ඔයා ඔතනට වෙලා ඉන්න හොදද
ළමයා : අනේ මිස් මට නම් බෑ මෙතන ඉන්න මම දැකලත් නෑ ඔය කථා කළේ කවුද කියලා සල්ලි දෙන්න නම් එපා මට වග කියන්න බෑ ඒ නිසා මම යනවා යන්න

ඔන්න ඔය විදයට තමයි මිනිස්සු රවටලා තවත් අය සල්ලි හම්බ කරන්නේ. මේ ළමයා මොලේ කල්පනා කළ නිසා එම මුදලට එම හොරාට අහු උනේ නැහැ. ඒ නිසා හැම කෙනාම හොඳට හිතට ගන්න කවුරු කථා කළත් අඳුරන්නේ නැති ෆෝන් නම්බර් වලින් කෝල් ආවම හොදට විස්තර හොයලා බලලා කථාකරන්න. රවට්ටන අය දැන් හැම තැනම ඉන්නවා. ඒ නිසා යුද හමුදාවේ කීර්තිනාමය විකුණලා කාගේ හරි නමක් කියලා කථා කරාම කාටවත් අහු වෙන්න කලින් පැහැදිලි උපදෙස් ලබාගන්න.

සෙ/311054 බනි II දිලුක බීපීඩී ආර්එස්පී
වයිට් හැකල් ප්‍රකාශන අංශය ශ්‍රීලපාහ

17(සෙව්) ශ්‍රීලපාහ | පුවත්

# ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපතිගේ කඳවුරු සංචාරය






ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඑඩීඒ කරුණාසේකර ආර්එස්පී යූඑස්පී එන්ඩියු පීඑස්සී විසින් 2015.03.10 වන දින මෙම ඒකකයෙහි කඳවුරු සංචාරයක නිරත වන ලදී. මෙම අවස්ථාවට ජ්‍යෙෂ්ඨ නිළධාරීන් රැසක් ද සහභාගි වූහ.

ඒකකය වෙත පැමිණි රෙජිමේන්තු අධිපති තුමන් අණදෙන නිළධාරි මේජර් ජේඑච්එම්එස්එස් ජයසුන්දර ශ්‍රීලපාහ විසින් මහත් හරසරින් පිළිගනිමින් කඳවුරු සම්මාන මුරයක් ද පිරිණමන ලදී. නිලධාරීන් හා සෙසුනිලයින් හඳුනා ගැනිමෙන් පසු කදවුරු භූමියේ පොල් පැළයක් රෝපණය කළ අතර, සෙසුනිල භෝජනාගාරය, කොනොනි සමාජ ශාලාව, ආවිගාරය, සෙසුනිල භට නිවාස නිරීක්ෂණයට ලක් කිරීමෙන් පසු කඳවුරු භූමියෙන් නික්ම යන ලදී. මෙවැනි නිරීක්ෂණ සංචාරයක නියැලුණු ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති තුමන් වෙත අණදෙන නිලධාරි තුමන් ප්‍රමුඛ සියලුම නිලයින් ගේ කෘතඥතාවය පුද කරමු.

බුද්ධි අංශය 17 ශ්‍රීලපාහ

14(සෙව්) ශ්‍රීලපාහ | පුවත්





# VII වන කණ්ඩුල

## ඓතිහාසික කැළණි විහාරය වදින්නට යයි...

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ අභිමානය ලෙස සැලකෙන කණ්ඩුල පරම්පරාවේ VII වන කණ්ඩුල හස්ති රාජයා රෙජිමේන්තු මධ්‍යස්ථානය පනාගොඩ කඳවුරේ සිට 2014 සැප්තැම්බර් මස 20 වන දින ඓතිහාසික කැළණිය රජමහා විහාරස්ථානය සමීපව පිහිටා ඇති මෙම ඒකක මූලස්ථානය ස්ථානගත කැළණිමුල්ල කඳවුර වෙත පැමිණෙන ලදි. එතැන් පටන් දෛනික චාරිත්‍රයක් ලෙස ගෞතම බුදුන් වහන්සේගේ පාදස්පර්ෂය ලැබ දෙස් විදෙස් බෞද්ධ බැතිමතුන්ගේ පූජනීයත්වයට පත් කැළණිය පුදබිම වන්දනාමාන කරමින් ඒකකයේ සියලුම නිලයින්ගේ ගෞරවයට පාත්‍ර වෙමින් කෙටි කාලයක් රැඳී සිටින ලදී.

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ මංගල වස්තුව වූ කණ්ඩුල හස්තියා 14 (සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ කෙටිකාලයක් හෝ රැඳී සිටීම අප ඒකකය ලද ගෞරවයක් බව සිහිපත් කරන්නෙමු.



# 8 ශ්‍රීලපාහ පුවත්

## 11 වන බළඇණි සංවත්සරය





ශ්‍රී ලංකා පාබල හමුදාවේ නවක බළඇණියක් ලෙස 1993 ජනවාරි මස 16 වන දින නි/50865 මේජර් ජේවිස් මාසක්කාර ආර්එස්පී ශ්‍රීලපාහගේ අණදීම යටතේ පනාගොඩ රෙජිමේන්තු මධ්‍යස්ථානය හිදී පළමුවන ආධාරක බළඇණිය ලෙස මෙම බළඇණිය ස්ථාපනය කෙරිණි. එසේ ආරම්භ කරන ලද මෙම බළඇණිය පසුව 8 වන බළැණිය ශ්‍රී ලංකා පාබල හමුදාව බවට පත් විය.

2000 වර්ෂයේදී 3 වන ශ්‍රී ලංකා පාබල හමුදාව සමඟ එක් වී 3/8 බළඇණිය ලෙස ඒකාබද්ධ විය. ඉන් පසු 2004.03.25 දින ස්වාධීන බළඇණියක් ලෙස නැවත 8 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව ලෙස ස්ථාපනය කරන ලදී. එසේ ස්ථාපනය කිරීමෙන් පසු වසර තිහක යුද්ධය නිමා කිරීම සඳහා ස්වකිය දායකත්වය ඉදුරාම ලබා දුන් 8 ශ්‍රීලපාහ ඒකකය 11 වන බළඇණි සංවත්සරය අභිමානවත් ලෙස සර්ව ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් සමරන ලදී.

ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් එල්එච්සීආර් සිරිවර්ධන ආර්එස්පී ශ්‍රීලපාහගේ ප්‍රධානත්වයෙන් සහ අනිකුත් අයවලුන්ගේ සහභාගිත්වයෙන් 2015.03.04 වන දින කෑරගල ක්‍රිස්තියානි දේවාස්ථානයේ දේවමෙහෙයක් ද, 2015.03.10 වන දින දෙමටගොඩ අහමදියියා මුස්ලිම් පල්ලියේ දේවමෙහෙයක් සහ 2015.03.11 සහ 12 යන දිනයන් තුළ අණදෙන නිලධාරී ඇතුලු ඒකක සමාජිකයින් සහ එම පවුල්වල සමාජිකයන් විසින් කතරගම කිරිවෙහෙර අභියසදී ඒකක ධජයට සෙත් පතා විශේෂ ආගමික වාතාවත් සිදු කර කතරගම දේවාලයේ දේව පූජාවක් ද පැවැත්විය.

2015.03. 21 වන දින 0900 පැයට පමණ අණදෙන නිලධාරී හට සම්මාන මුරයක් හා සම්මාන පෙළපාළියක්ද පිරිණැමීමෙන් අනතුරුව අණදෙන නිලධාරී විසින් ඒකක හටපිරිස් ඇමතීම සිදු කළේය. එදින සියලුම නිලයන් නියෝජනය වන පරිදි දිවා භෝජන සංග්‍රහයක් ද පවත්වන ලදී. එදින සන්ධ්‍යාවේදී සංගිත ප්‍රසංගයක් පැවැත්වීමට කටයුතු සිදු කළ අතර, ප්‍රථමයෙන්ම දැය වෙනුවෙන් දිවි පිදූ රණවිරුවන් සිහිකිරීමෙන් පසු 4 ශ්‍රීලපාහ අධිරිද්ම සංගිත කණ්ඩායමේ සංගිතයට මතුගම අරුන්දති නර්තන කණ්ඩායම නර්තනයෙන් දායකවිය. බළඇණි දිනට සමගාමීව කණ්ඩායම් අතර සුහදත්වය හා එකමුතුභාවය වර්ධනය සඳහා පැවැත් වූ ක්‍රිකට් සහ වොලිබෝල් තරඟාවලියේ ජයග්‍රාහකයන්හට කුසලාන හා සහතිකපත් පිරිනැමීම ද මෙහිදී සිදු කරන ලදී.

බළඇණි දිනය වෙනුවෙන් 2015.03.23 වන දින ඒකකයේ රාජකාරී කරනු ලබන සියලුම සිවිල් සේවක මහතුන් වෙනුවෙන් සාදයක් ද, 2015.03.27 වන දින බළලත් නිලධාරී සහ සැරයන් නිවස්නයේ සුහද හමුවක් ද, 2015.04.10 වන දින නිලධාරී නිවස්නයේ සුහද හමුවක් ද, පැවැත්වීමට කටයුතු කරන ලදී. නිලධාරී නිවස්න සුහද හමුවේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේවීඩීවී කරුණාසේකර ආර්එස්පී යුඑස්පී එන්ඩියු පීඑස්සී සහභාගි විය. ඒකකයේ ආරම්භයේ සිට අණදීම් කරනු ලැබූ විශ්‍රාමික සහ දැනට සේවයේ නියුතු සියලුම අණදෙන නිලධාරීවරුන් ඇතුලු විශාල ජ්‍යෙෂ්ඨ නිලධාරී පිරිසක් ද සහභාගී වූහ. එහිදී මේ දක්වා මෙම ඒකකය වෙත අණදුන් සියලුම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට හා ඒකකයේ රාජකාරී කරනු ලබන නිලධාරීන්ගේ දූ දරුවන් වෙත ද ත්‍යාග ලබාදීමට අණදෙන නිලධාරී අමතක නොකළේය. එදින 3 වන ගජබා රෙජිමේන්තුවේ අධිරිද්ම සංගිත කණ්ඩායම සංගිතයෙන් දායක විය. ඉදිරියේදි 8 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව දීප්තිමත් බළඇණියක් බවට පත් කිරීමට අණදෙන නිලධාරී ඇතුලු සියලුම දෙනාට තවත් ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.

බුද්ධි අංශය 8 ශ්‍රීලපාහ



# සූර්ය මංගල්‍යය සැමරුම

## 7 ශ්‍රීලපාහ පුවත්



සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට සංක්‍රමණය වීමත් සමඟ උදා වූ 2015 සිංහල හා හින්දු අලුත් අවුරුද්දට සමගාමීව 2015 අප්‍රේල් මස 10 වන දින කිලිනොච්චිය කනගපුරම් 7 ශ්‍රීලපාහ කඳවුරු භූමිය තුළදී ඉතා උත්කර්ෂවත් ලෙස බක්මහ උළෙලක් පවත්වන ලදී.

කිලිනොච්චි ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් සුදන්ත රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී, 57 වන සේනාංකාධිපති බ්‍රිගේඩියර් එච්ජේ සෙනවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී හා 571 වන බළසේනාධිපති කර්නල් කේඩීවීඩීඑස් කොළඹතන්ත්‍රි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පූර්ණ අනුග්‍රහය යටතේ ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් එම්පීඑස්පී කුලසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ගේ මඟ පෙන්වීම හා අධීක්‍ෂණය යටතේ සංවිධානය කටයුතු සිදු කරන ලදී.

මෙම බක්මහ උළලේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් 571 බළසේනාධිපති සහභාගී වන ලදී. පාරම්පරික ගැමි අවුරුදු ක්‍රීඩා රාශියක් එක්කර තිබූ අතර, එහිදී කුඩා දරුවන් පිළිබඳව විශේෂ සැලකිල්ලක් යොමුකොට තිබුණි. ඒකක බළ ප්‍රදේශය තුළ පදිංචි සිවිල් වැසියන් බොහෝ පිරිසක් ඒ සඳහා සහභාගී වූහ. එමෙන්ම කිලිනොච්චි මහාදේව ආශ්‍රමයේ නේවාසික කුඩා දරු දැරියන් මෙම බක්මහ අසිරිය විඳින්ට වූහ. එමෙන්ම ඒකකයේ රාජකාරි නියුතු නිලධාරී හා සෙසුනිලයින්ගේ පවුල්වල සාමාජිකයින් විශාල පිරිසක් ද, සහභාගී වීම විශේෂත්වයකි. ඔවුන් අප හා බැඳුණු මෙම අවුරුදු උළෙල බොහෝ කාලයක් අප මතකයේ රැඳී පවතින්නකි.



එදින උත්සවයට පැමිණ සිටි සිවිල් ජනතාව හා කුඩා දරුවන් සඳහා දිවා ආහාර වේලක් ලබාදීමට කටයුතු සිදු කරන ලදී. සවස් කාලයේදී 200 කට අධික කුඩා දරු දැරියන් වෙනුවෙන් අණදෙන නිලධාරී විසින් ත්‍යාග ලබාදීමෙන් අනතුරුව උත්සව කටයුතු නිමාවට පත් විය. මෙම කටයුතු සාර්ථක කර ගැනීම සඳහා කිලිනොච්චි ප්‍රදේශයේ පිහිටි රාජ්‍ය හා පුද්ගලික ආයතන විසින් විශාල දායකත්වයක් ලබාදෙන ලදී.

එදින රාත්‍රියේ ඒකකයේ සියලුම නිලයන්ගේ රසාස්වාදය උදෙසා සංගීත ප්‍රසංගයක් ඒකක සෙවන් බීට් සංගීත කණ්ඩායමේ සුමියුරු සත්සරයට පවත්වන ලද අතර, රජරට පුරවරයේ ෂයින්ස් ගර්ල්ස් ශිල්පිණියන් විසින් නර්ථනය සිදු කළහ. උදාවූ සිංහල හා හින්දු අලුත් අවුරුද්ද ලක්වාසී සැමට සාමය සතුට පිරි සුබ අලුත් අවුරුද්දක් වේවා යි ඉත සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.

## බළඇණි ඉදිරිපත් කිරීම (PRESENTATION)

57 වන සේනාංකය යටතේ පාලනය වන සියලුම බළඇණියන්හි නිලධාරීන්ගේ දැනුම හා කුසලතාවයන් වර්ධනය කිරීමට 57 වන සේනාංකාධිපති බ්‍රිගේඩියර් එච්ජී සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ සංකල්පයකට අනුව ආරම්භ කරන ලද මෙම වැඩ මුලුවේ සමාරම්භය 7 ශ්‍රීලපාහ ඒකකයෙන් සනිටුහන් කරන ලදී.

7 ශ්‍රීලපාහ ඒකකයේ නිලධාරීන් විසින් මැද පෙරදිග රැකියා කරන කාන්තාවගේ සාමාජ තත්ත්වය ( Social Implications of Women Employment In Middle East) නමැති මාතෘකාව යටතේ හරවත් සංවාදාත්මක විචාරයක් ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් එම්පීඑස්පී කුලසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ඇතුලු නිලධාරීන් 08 දෙනෙකු විසින් 2015 මැයි 09 වන දින බළඇණි ශ්‍රවණාගාරයේදී ඉදිරිපත් කළහ.




බුද්ධි අංශය 7 ශ්‍රීලපාහ

# SOLDIER

## Lawyer and Diplomat

### Major General Hemachandra Wickrama Gerard Wijeyekoon

Major General Hemachandra Wickrama Gerard Wijeyekoon OBE., ED., was the elder son of Sir Gerard Wijeyekoon, President of the Senate and Lady Wijeyekoon Soldier, lawyer and diplomat Major General HWG Wijeyekoon was born on June 25, 1911. He schooled at St Joseph's Collage Colombo and entered Oxford University. After his graduation (BA), he was called upon to the Bar as a successful advocate of the Supreme Court of Ceylon and later joined the public service as a Lan.d Settlement Officer. He was married to Olive Wickrarriasinghe and they had two sons and a daughter.

He joined the Ceylon Light Infantry Volunteers and was appointed as a Second Lieutenant on March 1,1935. With the outbreak of the Second World War, he was mobilized. In 1939 and promoted to the rank of Captain on November 29, 1940. Having posted to three CLI, he had attended a Tactics course at Poona, India·. He was promoted to the rank of' Major on June 4, 1942 and Lt Col on December 8, 1944.

As a Lt Col, he commanded a Battalion of the Ceylon Light Infantry during the war. On termination of the war and subsequent demobilization of the units, he was made non-effective from March 2, 1946.

It was of an interest to record that after independence, Lt Col HWG Wijeyekoon was personally selected by then Prime Minister, DS Senanayake as the Secretary to the Chief Whip in the House of Representatives. With the growth of the Ceylon Army, on October 10, 1949, a regular infantry Battalion, named the Ceylon Infantry Regiment was formed and Lt Col HWG Wijeyekoon, was recalled to receive a commission in this Regiment in June 1950. In June 1950 this Regiment was redesigned as the first Battalion the Ceylon Light Infantry on November 15, 1949. Lt Col HWG Wijeyekoon, continued as its commanding officer and became as the First Commanding Officer of the Battalion. Lt Col HWG Wijeyekoon. Was the first to introduce the regimental custom of toasting the motherland or the queen with arrack. Patriotic person LT Col HWG Wijeyekoon, preferred to consume a local drink for this purpose. LT Col HWG Wijeyekoon, relinquished the command from first CLI on December 31, 1953. Subsequently he assumed duties as the Chief of Staff of the Ceylon Army on January 1, 1954. He held this appointment till February 9, 1955 on which date he was promoted to the rank of Col and appointed to act as Commander of the Army till January 1, 1956.



From February 17, 1956 to November 14, 1959, he was the Commandant of the Ceylon Volumteer Force. During this period he was the acting Commander of the Army on four occasions. On November 14, 1959 Col HWG Wijeyakoon, was promoted to the rank of Brigadier and Major General on January 1, 1960.

After his retirement, he was appointed High Commissioner of Ceylon to Pakistan, with concurrent accreditation to Iran. After his tenure in Pakistan he was appointed Ambassador to Italy with concurrent accreditation to Greece. While serving in Italy he met with a Motor accident and sustained fatal injuries. He was accorded military funeral on April 6, 1969 at Borella, Kanatte with the participation of a distinguished gathering including Prime Minister Dudley Senanayake and the Leader of the Opposition Sirimavo RD Bandaranaike. As a Commanding Officer Lt Col HWG Wijeyekoon had paid special attention to the welfare of soldiers and religious activities. He was the first to introduce Sinhalese words of command on the parade ground and trained his men through the medium of mother tongue. As the Commandant of the Ceylon Volunteer Force he formed the Army Hewisi Band consisting of oriental drummers and pipers.

Major General Wijeyekoon was an exemplary officer and a gentleman to his fingertips during the period he acted as commander. He displayed qualities of organization and administration tempered with impartiality which were acknowledged by the officer corps of the Army.

***Maj Gen HV Athukorala (Retd) VSV psc FBIM***

## 23 ශ්‍රීලපාහ පුවත්

# මුලතිව් වෙසක් අසිරිය



ලොව දස දෙස වෙසක් අසිරියෙන් ආලෝකමත් වන විට මෙවර මුලතිව් දිස්ත්‍රික්කයේ වෙසක් කලාපය මුලතිව් මහජන ක්‍රීඩාංගනයේදී මහත් උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි. ආසේමු(මු) ආඥාපති මේජර් ජෙනරාල් එන්ඒජේසී ඩයස් ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී ගේ සංකල්පයක් මත මුලතිව් ප්‍රදේශයේ වෙසක් කලාපය සඳහා නිර්මාණ ඉදිරිපත් කරන ලදී. ඒකක අණදෙන නිලධාරීගේ මඟ පෙන්වීම මත මෙම බළඇණිය ද සිදුහත් කුමරුගේ උපත පිළිබිඹු කෙරෙන ඉතා විචිත්‍රවත් වෙසක් පහන් කූඩුවක් නිර්මාණය කරන ලදී.



ආසේමු (මු) බළප්‍රදේශයේ 59 සේමු යටතේ පැවැති බසේමු සහ ඒකකයන් අතර පැවති මෙම වෙසක් පහන් කූඩු තරඟාවලියේ අටවන ස්ථානය දක්වා ත්‍යාග බෙදාදීම 59 සේනාංකාධිපති ගේ සුරතින් සිදු කරන ලද අතර, පැමිණ සිටි සිවිල් වැසියන් 3000 ක් දෙනා වෙනුවෙන් මහ බත් දන්සැලක් ද, එදින රාත්‍රි පැවැත්විණි. ආරක්ෂක සේනා මූලස්ථාන ආඥාපති මේජර් ජෙනරාල් එන්ඒජේසී ඩයස් ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී එන්ඩීසී ගේ සුරතින් එය විවෘත වූ අතර එතුමන් සමග 59 සේනාංකාධිපති බ්‍රිගේඩියර් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව් ආර්එස්පී ද සහභාගි වූහ.



## සිංහල අලුත් අවුරුද්ද වෙනුවෙන් පැවැත්වූ

# ක්‍රිකට් හා වොලිබෝල් තරඟාවලිය



උදා වූ සිංහල දෙමළ අලුත් අවුරුද්දට සමගාමීව 2015 අප්‍රේල් මස 10 වන දින මුලතිව් මහජන ක්‍රීඩාංගනයේදී අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් එස් විජේසිරිවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහගේ පූර්ණ අධීක්ෂණය යටතේ අන්තර් කණ්ඩායම් ක්‍රිකට් සහ අත් පන්දු තරඟාවලියක් පවත්වන ලදී. ක්‍රිකට් තරඟය සඳහා කණ්ඩායම් 6 ක් තරඟ කළ අතර, එම සියලු කණ්ඩායම් අභිබවා අණ හා පාලන "ඒ" කණ්ඩායම ශූරතාවය දිනාගන්නා ලදී. සන්ධ්‍යාවේ පැවති අත් පන්දු තරඟාවලියේදී ශූරතාවය "ඩී" කණ්ඩායමටත්, අනු ශූරතාවය අණ පාලන කණ්ඩායමටත් හිමිවිය.





# 24 ශ්‍රීලපාහ පුවත්



## ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති තුමන්ගේ කඳවුරු සංචාරය

ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේඩීපී කරුණාසේකර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී විසින් 2015.03.05 වන දින 24 ශ්‍රීලපාහි කඳවුරු සංචාරයක නිරත විය. අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් එස්එන්එම්ඩීබී අරඹේපොල ශ්‍රීලපාහ සහ අනෙකුත් නිලධාරීන් ගේ උණුසුම් පිළිගැනීමත් සමගින් කඳවුරු භූමියේ අඹ පැළයක් ද රෝපනය කළ එතුමන් භට පිරිස් අමතා හරවත් දේශනයක් සිදු කර සංචාරය නිමාවෙන් පසු කඳවුරු භූමියෙන් නික්ම යන ලදී. රෙජිමේන්තු අධිපති තුමන් ලෙස ජ්‍යෙෂ්ට නිලධාරියෙකු මෙම ඒකකයේ සංචාරයක නියැලුන් ප්‍රථම අවස්ථාව මෙය වන අතර, රෙජි අධිපති තුමන් වෙත අණදෙන නිලධාරී තුමන් ඇතුලු සියලුම නිලයින්ගේ කෘතඥතාවය මෙසේ එල කර සිටිමු.

## සම්බුදු තෙමඟුලේ අසිරිය



වෙසක් උත්සවය නිමිතිකොටගෙන මෙම ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් එස්එන්එම්ඩීබී අරඹේපොල ශ්‍රීලපාහගේ සංකල්පයකට අනුව සියලුම නිලධාරී සහ සෙසුනිලයින්ගේ සහයෝගය ඇතිව පස්වන වරටත් බත් දන්සලක් පැවැත් විය.

මන්නාරම මැදවච්චිය ප්‍රධාන මාර්ගයේ පිහිටි මැණික්ෆාම් බළඇණි පුහුණු පාසලේදී පෙරවරු 1100 ට යෙදුන සුබ මොහොතින් 213 බළසේනාධිපති කර්නල් එච්එම්ඩබ්ලිව්කේ හේරත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ සුරතින් එය විවෘත විය.

## අනුරපුරයෙන් පලමු තැන ලැබූ වෙසක් පහන් කූඩුව



වෙසක් පුන් පොහෝ දිනට සමගාමීව අනුරාධපුර මහනගර සභාව හා අනුරාධපුර තරුණ පදනම වාර්ෂිකව සංවිධානය කළ පහන් කූඩු තරගාවලිය මෙවරත් මැයි මස 03, 04 සහ 05 යන දිනයන් හිදී අනුරාධපුර බුද්ධගයා මාවතෙහි පැවැත් විය.

ඒකක අණදෙන නිලධාරීගේ උපදෙස් මත හා ක්‍රියා හා පුහුණු භාර නිලධාරී ගේ නොමසුරු සහයෝගය මත මෙම තරඟාවලිය සඳහා පහන් කූඩුවක් නිර්මාණය කර ඉදිරිපත් කරන ලදී. තරඟාවලිය සඳහා පහන් කූඩු 70 පමණ සංඛ්‍යාවක් ඉදිරිපත් කර තිබූ අතර, සියලු පහන් කූඩු අතුරින් මෙම ඒකකය වෙතින් ඉදිරිපත් කළ පහන් කූඩුවට තරඟාවලියේ පළමුවන ස්ථානය හිමි විය. මෙම පහන් කූඩුව නිර්මාණය කිරීම සඳහා දායකත්වය ලබාදුන් සෙ/307534 බනි ෂෂ රත්නසේකර ඩබ්ලිව්ඩීඩබ්ලිව් ආර්එස්පී විසිනි. මෙම කලාකරුවා වෙත ශ්‍රීලපාහ රෙජිමේන්තුවෙත්, ඒකකයේ අණදෙන නිලධාරී ඇතුලු සියලුම නිලධාරී සහ සෙසුනිලයින්ගේ කෘතඥතාවය මෙසේ පිළිගන්වමු.

බුද්ධි අංශය 24 ශ්‍රීලපාහ

# පැණි කොමඩු ඇට විසි කරන්න එපා



පැණි කොමඩු අනුභව කිරීමේදී එහි ඇති ඇට කරදරයක් වුනත්, එම ඇට ඉතාමත් ප්‍රයෝජනවත් ලෙස භාවිතා කරන්නට හැකියාව තිබෙනවා.එම ඇට ගිලුනොත් අයහපත් ප්‍රතිපලයක් ඇතිවෙතැයි ඔබ බිය වෙන්නට ඇති, නමුත් එවැනි අනියත බියත් ඇති කරගත යුතු නැහැ. මොකද ශරීර අභ්‍යන්තරයේ ඒවා පැලවීමට ඉඩක් නැහැ. පැණි කොමඩු ගෙඩියෙන් අරගත් විගස ඇට අනුභව කරනවාට වඩා ඒවාට පැලවීමට (ඉකිරී ඇදීමට) ඉඩලබා දෙනවානම් වඩාත් හොඳයි.පැලවෙන්නට සහ වියලෙන්නට ඉඩලබා දුන් පසුව, ඒවා ප්‍රෝටීන් බවට පත්වෙන අතර, එවැනි කොමඩු කෝප්ප 1/8 ක යෝගට් එකක අන්තර්ගත වෙන ප්‍රෝටීන් ප්‍රමාණයම අන්තර්ගත වෙනවා.ජීර්ණ පද්ධතියේ ක්‍රියාකාරීත්වය නගා සිටුවීමේ හැකියාවක් එම ඇට වල ඇති නිසා ඒවා අනුභව කිරීම ඉතාමත් හිතකරයි. පරපෝෂිතයින් සමග සටන් කිරීමේ රෝගප්‍රතිරෝධක ගුණාංගයක්ද එහි ඇට වල ඇති බව පැවසෙනවා. සිට්‍රියුලයින් කියන ප්‍රතිඔක්සිකාරකද එහි ඇති නිසා අධි රුධිර පීඩනයට, අධික වෙහෙස නිසා ඇතිවෙන පපුවේ රිදුමට සහ රුධිර නාලිකා සිහින් වීමේ රෝගයටද එහි ඇට වඩාත් හිතකරයි.

විසිවෙනි ශතවර්ෂයේ විසූ සුප්‍රසිද්ධ චරිතයක් වන එඩ්ගා කේසී පවා පැණි කොමඩු ඇට වල ඇති සුවිශේෂී ගුණාංගයන් අගයකොට තිබෙනවා. එඩ්ගා කේසි පවසන පරිදි, පැණි කොමඩු ඇට වල ඇති සෞඛ්‍ය ගුණාංගයන් වකුගඩු සහ මුත්‍රාශය සඳහා හිතකරයි. නැවුම් පැණි කොමඩු ඇට මගින් සාදාගන්නා තේ පානය කිරීමෙන් වකුගඩු ගල් දිය කරගැනිමට හැකි අතර, වකුගඩු සහ මුත්‍රාශය පිරිසිදු කරගැනිමටද හැකියාව ඇති බව එඩ්ගා කේසි පවසනවා.

එඩ්ගා කේසි නිර්දේශ කරන එම ප්‍රතිකාරය නැවුම් පැණි කොමඩු ඇට මේස හැඳි හතරක් හොඳින් තලාගෙන ඊට වතුර ලීටර් දෙකක් එකතු කොට මිනිත්තු 15ක් හොඳින් පිසගත යුතුයි. එලෙස සාදාගන්නා පානය තැන්පත් කරගෙන දවස් දෙකක් පුරාවට පානය කලයුතු අතර, තුන්වෙනි දවසේදි විරාමයක් ගත යුතුයි. දවස් දෙකකට එක් දවසක් විරාමයක් වෙන්න සති කිහිපයක් මෙම ප්‍රතිකාරය භාවිතා කිරීමෙන් විශ්මිත ප්‍රතිඵල ලබාගන්නට පුලුවන්. හදවත සහ ශාරීරක මසුපිඩු ශක්තිමත් කරගැනිමට සඳහාත් කොමඩු ඇට නිර්දේශ කරනවා. තේ මගින් හෝ සුලු ආහාරයක් වශයෙන් මෙම පැණි කොමඩු ඇට අනුභව කිරීමේදී මතකය සහ මානසික එකාග්‍රතාවය ඉහල නැංවෙනවා. සම අලංකාරවත් සහ නිරෝගී කරගැනීම සඳහාත් මෙම ඇට උපකාරී වෙනවා. පිරිමින්ගේ කාම රාගය අවුලුවා ලිමේ හාකියාවක්ද මෙම ඇට වලට ඇති බව වාර්තා වෙනවා. දියවැඩියාවෙන් පීඩා විඳින පුද්ගලයින්ද පැණි කොමඩු ඇට තේ පානය කරනවා නම් වඩාත් හොඳයි.

<u>අන්තර්ජාලය ඇසුරෙන්</u>

**ලාන්ස් කෝප්‍රල් රත්නකුමාර ඩීකේඑන්එන් - වයිට්හැකල් ප්‍රකාශන අංශය**

# නව බළඇණි පාලන පෙදෙස

වර්ෂ 2015ක් වූ ජුනි මස 11 වන දින 20 ශ්‍රීලපාහ මුක්කම්පන් කඳවුරෙහි නව බළඇණි පාලන ප්‍රදේශය අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් අයිපී ජයසිංහ ශ්‍රීලපාහගේ ආරාධනයෙන් 66 සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ පීඑස්සී විසින් සෙසුනිලයන්ගේ ප්‍රයෝජනය සඳහා එළැඹි සුබ මොහොතින් විවෘත කරන ලදී.

අණදෙන නිලධාරිගේ විශිෂ්ට නායකත්වය හා මගපෙන්වීමෙන් සියලුම අයවලුන්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉදි කරනු ලැබූ මෙම නව පාලන පෙදෙසෙහි මුලුතැන්ගෙය, බේකරිය, ජනක යන්ත්‍රය හා කාර්මික අංශය, උපකරණ ගබඩාව, ප්‍රවාහන අංශය, සුළු නඩත්තු අංශය, සළාක අංශය, ඇඹරුම් අංශය සහ සෙසුනිල හටනිවාස ඇතුලු සියලුම අංග උපාංග වලින් බළඇණි පාලන පෙදෙස සමන්විත විය. 66 සේනාංකාධිපති විසින් කඳවුරු භූමියේ අඹ පැළයක් රෝපණය කර ඉන් පසු ඒකක වෙතින් පිළියෙල කරන ලද තේ පැන් සග්‍රහයට සහභාගී වී ඉන් අනතුරුව හටපිරිස් අමතා දේශණයක් කරන ලදී. එහිදී මෙවන් කඳවුරක ඉදි වූ මෙම බළඇණි පාලන පෙදෙස අනෙකුත් බළඇණි සඳහා නිර්දේශාත්මක වශයෙන් ඉදිකිරීම පිළිබඳව අණදෙන නිලධාරී ඇතුලු සියලුම අයවලුන් වෙත ශුභාශිංසනය පිරිණැමීම සිදු කලේ ය.

**බුද්ධි අංශය 20 ශ්‍රීලපාහ**

# 20 ශ්‍රීලපාහ පුවත්







# දසුනේ හසුන

මොණර පිල සේ වරලස විදා
නෙත් කොනින් නුඹ බැලූම හෙලා
අරුන්දතියේ මය දෙනුවන් සැදා
මන බඳියි සිත් අඩහැර නගා

නෙළු අරුංගල් කන්පෙති සැරසුමට
පබළු මාලය හැඩකලා ගෙලවට
අමැසි නැත අරුමෝසම් රනැඟිල්ලට
තව මල් කුමටද නුඹ වත කමලට

නං දළු දෙලුමනිය තොල්පෙති සඟලට
දසන් මුතුමය නුඹේ සිනහවට
දොසක් නොවේවා මේ නාඹරියට
දෙව් රූදේවී යෙහෙන් මනුවට

ලැසි ගමනින් පැමිණියේ පෙරටම
බක් මහේ නුඹ මෙන්න ද කුමරිම
හැඩතල අඩුවේ එන හැම දිනකම
මෙයන් සිරිකත එදිනට පිරෙයි නිවසම



දසුන : වයිට් හැකල් ඡායාරූප අංශය ශ්‍රීලපාහ
හසුන : සෙ/319573 කෝප්‍රල් තරංග ඩීඑම්ඩී



# මංගල සීනු

## වාසනාවන්... ජයමංගලම්..



12 ශ්‍රීලපාහ නි/68352
ලුතිතන් ඒඊ මධුසංක ආර්එස්පී ශ්‍රීලපාහ
2015. 01.22 වන දින
එරංගා කසුන් මධුවන්ති මෙනෙවිය
සමග යුග දිවියට පා තබන ලදි.



10 ශ්‍රීලපාහ සෙ/321545
කෝප්‍රල් ප්‍රනාන්දු එච්කේඑස්එස්
2015. 05. 04 වන දින
සුරේෂි ජයසිංහ මෙනෙවිය
සමග යුග දිවියට පා තබන ලදි.



10 ශ්‍රීලපාහ සෙ/326222
ලාකෝ මුතුමාල ඩබ්ලිව්
2015. 03. 14 වන දින
රාන්චනා මෙනෙවිය
සමග යුග දිවියට පා තබන ලදි.

# ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත
# උදාර රණවිරුවන් 210 ක් එක්වූ වගයි

## ශ්‍රීලපාහ පුහුණු පාසල පුවත්



රෙජිමේන්තු පුහුණු පාසල ආරම්භයේ සිට මේ දක්වා පාඨමාලා අංක 38 සිට අංක 94 දක්වා පාඨමාලා 56 ක් සාර්ථකව නිම කර ඇති අතර, ආධුනික සෙබළුන් දස දහස් ගණනක් ජාතියට දායාද කර ඇත. මෙම පුහුණු පාසල තුළින් ආධුනික සෙබළුන් හට ඉතා උසස් මට්ටමක මූලික පුහුණුවක් ලබා දීම සඳහා ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ සේනාවිධායක ගේ මාර්ගෝපදේශකත්වය හා අනෙකුත් සියලුම අයවලුන්ගේ නොමසුරු දායකත්වය මත හා පුහුණු පාසල් සේනාවිධායක ලුතිතන් කර්නල් ඒඑම්එම් ගුණසේකර ශ්‍රීලපාහ ගේ පූර්ණ අධීක්ෂණය යටතේ එහි ප්‍රධාන උපදේශක මේජර් කේවීකේ කරුණාරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ හා උපදේශක මඩුල්ල සමඟින් පුහුණු පාසලේ රාජකාරී නියුතු සියලුම අයවලුන් විසින් උපරිම සේවයක් ලබාදී ඇත.

රෙජිමේන්තු පුහුණු පාසල වෙතින් ආධුනික පුහුණු පාඨමාලා අංක 94 (නිත්‍ය/සෙවී) හි ආධුනික සෙබළුන් 210 ක් ඉතාම සාර්ථකව පාඨමාලාව හදාරා 2015.03.14 දින විසිර ගියහ. මෙම විසිරියාමේ පෙළපාළියේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් 241 බසේමු හි බළසේනාධිපති කර්නල් පීකේපී ගමගේ ආර්එස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී සහභාගී වූ අතර, පෙළපාළිය වර්ණවත් කිරීම සඳහා අලංකාර සරඹ සංදර්ශනයන් කීපයක්ම පැවැත් විය. පසුව ආරාධිත අමුත්තා විසින් පැමිණ සිටි පිරිස ඇමතීම සිදු කළ අතර, විසිර යන ආධුනික සෙබළුන් හට තම හෘදයංගම සුබාශිංසන පිරිනමන ලදී. පාඨමාලාවේ දක්ෂතම උපදේශකයින් සහ ආධුනික සෙබළුන් හට කුසලතා සම්මාන පිරිණැමීම ද සිදු කරන ලදී.

මෙම පාඨමාලාව සාර්ථකව නිම කර ගැනීම සඳහා හැකි උපරිම අයුරින් සහයෝගය ලබාදුන් සියලු දෙනාටත්, විසිර යන ආධුනික සෙබළුන්ට රට ජාතිය ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි රෙජිමේන්තු පුහුණු පාසල ශ්‍රීලපාහ හි ප්‍රධාන උපදේශක ඇතුලු සියලුම නිලධාරී හා සෙසුනිලයින් විසින් ප්‍රාර්ථනා කරන්නෙමු.





රෙජිමේන්තු පුහුණු පාසල බූස්ස

11 ශ්‍රීලපාහ //// පුවත්

## නිලධාරි නිවස්නයට නව ගොඩනැගිල්ලක්





ඒකක නිලධාරි නිවස්නය සඳහා අඩු පාඩුවක්ව පැවති නිලධාරි විවේකාගාර ගොඩනැගිල්ල ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඩීඩීඑස් පෙරේරා ශ්‍රීලපාහ ගේ පූර්ණ මඟ පෙන්වීම යටතේ ඉදි කරන ලදී. 2015 මැයි මස 23 වන දින 0827 පැයට එළඹි සුබ මොහොතින් අණදෙන නිලධාරි විසින් විවෘත කළේ ය.

## කරෙයිනගර් දූපතටත් වෙසක් අසිරිය





බුදු තෙමගුල සමරන වෙසක් පුන් පොහෝ දින යාපා පටුනේ කාරෙයිනගර් දූපතේ සිත් සතන් පහන් කරවන්නට අණදෙන නිලධාරිගේ පූර්ණ අධීක්ෂණය යටතේ කරෙයිනගර් වෙරළ තීරයට යාබදව වෙසක් කලාපයක් නිර්මාණය කරන ලදී. ප්‍රබන්ධ ජාතක කථා පිළිබිඹු වන මුචලින්ද නාග දර්ශනය, නලපාන ජාතකය, රුවන්වැලිසෑ ආකෘතිය, දළදා මාලිගාවේ මංගල හස්තියාගේ ආකෘතිය මෙන්ම විචිත්‍රවත් පහන්කූඩු රැසක් හා සඟමිත් තෙරණිය ආ රුවල් ඔරුවේ ආකෘතිය නිර්මාණය කරමින් ඉතා මනරම් වූ සුවිශේෂී අංගයන්ගෙන් සමන්විත විය.

මෙම පහන්කූඩු තරඟාවලියේ විනිශ්චය සඳහා 2 (සේවා)ශ්‍රීලපාහ ඒකකයේ විනිසුරු මඬුල්ල සාධාරණ විනිශ්චයකින් නිලධාරි හා සෙසුනිලයින්ගේ තරඟ කාර්ත්වය මැන බැලීමක් ද සිදු කරන ලදී.

වෙසක් අසිරිය නැරඹීමට පැමිණෙන සහ වන්දනාමාන කටයුතු කරන බැතිමතුන්ට මෙන්ම ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් 2015 මැයි මස 03 වන දින උදෑසන 0700 පැයට ආලඩි මංසන්ධියේදී කඩල දන්සැලක් හා සිසිල්පැන් දන්සැලක් ද පැවැත්විය.



# කල් අරණේ සිට!



## සැකය

ලොව තුළ සැකය තරම් වූ
භයානක අවියක් තවත් නොමැත
එය එකිනෙකා වෙන් කරයි
මිතු දම් විනාශ කරයි
විටෙක කටු අකුළක් මෙන්
දුක් වේදනා ගෙන දෙන අතර,තවත් විටෙක
අසිපතක් වී ජීවිතයද විනාශ කරයි

සෙ/322624 කෝප්‍රල් බණ්ඩාර ආර්එම්එස්ආර්එස්

## සමාවෙන්න

පිපාසයට දිය බිඳක් සොයා යන
මුව පොව්වකු සේ පසුපසින් දිව ගිය
ඉල්ලමින් ඔබේ ආදරේ
කවදාවත් එකදු වචනයක් හෝ මා හා
නොදොඩවමින් ඔබේ දෙනෙතින් කීවා
නැහැ ඔබට මා ආදරේ
පමා වෙලා හෝ දැනෙන්නට
ලැබීමත් සතුටකි
ඔබ මා වැනිම සෙබළෙකුගේ
දිරිය ළඳක් කියා
සමාවෙන්න මට...

සෙ/317270 කෝප්‍රල් නුවන් ඩබ්ලිව්ඩී 25 ශ්‍රීලපා



## පොපි මල්

| | |
|---|---|
| නිවසට නිදහස යන්නට ඉඩ | දුන්න |
| ගමේ අයත් එක්කල සතුටින් | ඉන්න |
| වැඳ මව්පියන් හට කැඳවූර වෙන | එන්න |
| ජීවිතේ පුදපු විරුවනි පොපි මල් | මෙන්න |

සෙ/324552 කෝප්‍රල් විමලරත්න ඩබ්ලිව්ජීඩබ්ලිව් 15 ශ්‍රීලපාහ



## නුඹයි නුඹේ ආදරයයි

තරු මල් අතරේ සැඟවුනු
දුක්බර හීනය දකින්න
අමාවක අහස සේ දුක දැනුනට
කඳුළු පිරෙන හැටි බලන්න
පිණි බිඳුවක් මලට කීව
ආදර වදනක් අහන්න
නුඹට හැකිද හැමදාමත්
මගේ හිතට ඇවිත් ඉන්න
නුඹයි නුඹේ ආදරයයි
ජීවිතයට ලං කරන්න
සඳ මඬලක් වෙලා ඇවිත්
ළඟින් ඉඳන් එළිය දෙන්න
සංසාරේ හැමදාකම
මා සතුටින් බලා ගන්න
ඔය පෙම්බර ආදර හිත
මගේ ළඟින් තියා යන්න

සෙ/321250 ලාන්ස් කෝප්‍රල් හේමසිරි පී ආර්එස්පී 15 ශ්‍රීලපාහ



## දුක හිතෙනවා ආවම ගම රට පැත්ත

| | |
|---|---|
| නිදන් හොරුන් කුඩු කරලා | ගල්පොත්ත |
| වස විස කැවී වක්කඩෙ දන්ඩියෝ | රොත්ත |
| ඕලු නෙලුම් මානෙල් වැදවෙලා | ඇත්ත |
| දුක හිතෙනවා ආවම ගම රට | පැත්ත |
| | |
| වැඩිපල අතැර පින දහමට | නොනගතය |
| හෙළ කුල සිරිත ගුණ දහමට | මුල්තැනය |
| එනමුත් මෙදා නොනගතයෙන් | අවනඩුය |
| ඇණුම් බැණුම් යහමින් ගුටි කෙළි | සරුය |
| | |
| ගෙයින් ගෙයට අපි නැගම් ගිය | සිරිත |
| බුලත් හුරුළු දී වැඩිහිටි වැඳි | සිරිත |
| අද අමතකයි කාටත් අවුරුද්දක | අරුත |
| ඉස්සර මතක සුවදැයි තාවමත් | මසිත |
| | |
| නගරෙන් ගමට ඇවිදින් මත්කුඩු මත් | වතුර |
| වීනකොට තිබෙයි වනසා සදහම් | ඇසුර |
| නැකතට පිපිරවෙන විට බැදි ගිණිකෙලි | පොකුර |
| කොහා හඬයි දුක කියමින් අතු | පතර |

මේජර් එම් ගුණරත්න ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාහ වයිට් හැකල් ප්‍රකාශන අංශය



## ආදරණීය යුතුකම

දස මසක් කුසේ හොවාගෙන
මේ ලෝකෙට මා බිහිකළ
පපුවට තුරුළු කරගෙන ආදරයෙන්
සෙනෙහස දුන්නු
රැයක් දවාලක් නොබලා දහදිය කඳුළු වගුරවමින්
මගේ ඔබ පුරවන්න වෙහෙසුනු
මහමෙරක් තරම් ප්‍රාර්ථනා...
හින්වල පොදි ගැසුනු
ආදරණීය අත්වල
හොඳටම කරගැට මගෙ අම්මේ...
මගේ තාත්තේ...
සන්තකින්ම සැබෑ කරනවා
ඒ ප්‍රාර්ථනා
ලොකු මිනිසෙක් නොවෙයි
හොඳ මිනිසෙක් වෙලා...

සෙ/318837 කෝප්‍රල් විජේරත්න ඒසීකේ
"බී" කණ්ඩායම 6 ශ්‍රීලපාහ

## මහ බර අවි



මහබර අවි නිහඬ කරමින්
නිවට කොටි රැල දණ ගැස්සවූ
තුන් හෙලයම සිංහ නදින්
ගිගුම් දුනි මහා අසිරියෙන්........
අතින් අත මාරුවූ මේ පුංචි මුතු ඇටය
යළිත් කිසිදා නොදෙමු කාටත්
එය අපේ පණ නළය......
මහා වංශය යළිත් ලියවූ
සෙබළ විරුවන් දිගු කළක්
ඔබේ සෙනවියන් සමඟින්.........

සෙ/320079 කෝප්‍රල් ගනේගොඩ පීවල්ව් 6 ශ්‍රීලපාහ

## ගෞ ළු ෂ ක ව



කොළුකම මතුවන නව යෞවනයේ
ඉන්නට සිදුවා මහ කල් අරණේ
රට දැය රැකුමට උරදි රිසිසේ
දිවියම ගෙවමි අභිමන් සිතින්

සෙ/327092 සාසෙ ප්‍රශාන් ඊචම්පී 6 ශ්‍රීලපාහ

# ශ්‍රීලපාහ සෙසුනිල නිවාඩු නිකේතනය බූස්ස

20 වන යුද්ධ හමුදාධිපති ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී (විශ්‍රාමික) ගේ සංකල්පයකට අනුව රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඒඩීඒ කරුණාසේකර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ අධීක්ෂණයෙන් සෙසුනිල නිවාඩු නිකේතනය බූස්ස ප්‍රදේශයේ ස්ථාපනය කරන ලදී. මෙම නිවාඩු නිකේතනය මගින් දකුණු පුරවරයේ සුන්දරත්වය විඳින්නට පැමිණෙන සෙසුනිලයන් සඳහා පහසුකම් ලබාගැනීමට අවස්ථාව උදා කර දී ඇත. මෙහි අංග සම්පූර්ණ කාමර තුනකින් සමන්විත වේ. තවද, සිවිල් අයවලුන්ටද මෙහි පහසුකම් ලබාගැනීමට හැකියාව ඇත.







**එක් දිනක් සඳහා**

| | |
|---|---|
| රෙම් ශ්‍රීලපාහ සෙසුනිලයින් සඳහා | රු. 1000.00 |
| වෙනත් රෙජිමේන්තු වල සෙසුනිලයින් සඳහා | රු. 2000.00 |
| සිවිල් පුද්ගලයින් සඳහා | රු. 3000.00 |

# ප්‍රහේලිකා අංක 62
## 84 වන වයිට් හැකල් සඟරාව

### වයිට් හැකල් ප්‍රහේලිකාව අංක 62

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 3 | | 5 | 4 | | 2 | 7 | | 8 |
| | 1 | | | 8 | | | 3 | |
| 7 | | 4 | 9 | | 1 | 6 | | 5 |
| 8 | | 3 | 7 | | 4 | 1 | | 2 |
| | 2 | | | 5 | | | 4 | |
| 4 | | 7 | 2 | | 8 | 3 | | 6 |
| 6 | | 9 | 1 | | 5 | 2 | | 3 |
| | 7 | | | 2 | | | 6 | |
| 1 | | 2 | 8 | | 6 | 5 | | 9 |

## ප්‍රහේලිකාව ගැන

1. කුඩා කොටු නවයකින් සමන්විත වූ විශාල කොටුවක් නිර්මාණය වී ඇති අතර එවැනි කොටු නවයකින් මෙම ප්‍රහේලිකාව සම්පූර්ණ වී ඇත.

2. කුඩා කොටු නවය තුළ 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර, එය පිළිවෙලකට අවශ්‍ය නොවේ.

3. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටු නවය සම්පූර්ණ කළ පසු 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතුය.

4. ඉහත සඳහන් පරිදි ප්‍රහේලිකාව සම්පූර්ණ කළ පසු සිරස් සහ තිරස්, හරස් අතට 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර පිළිවෙලකට අවශ්‍ය නොවේ.

5. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටුවක හා තිරස් සිරස් හා හරස් අතට එකතු වේ අගය 45 ක් විය යුතුය.

6. කුඩා කොටුවක් තුළ හෝ සිරස්, තිරස් හා හරස් අතට අංක යෙදීමේදී එකම අංකය දෙතැනක සඳහන් නොකළ යුතුයි. සඳහන් කළ හැක්කේ එක් වරකි.

# වයිට්හැකල්
# ප්‍රහේලිකා අංක 61

## වයිට් හැකල් ප්‍රහේලිකාව අංක 61

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 4 | 7 | 6 | 1 | 9 | 8 | 3 | 2 | 5 |
| 8 | 2 | 9 | 6 | 5 | 3 | 7 | 4 | 1 |
| 3 | 5 | 1 | 7 | 4 | 2 | 9 | 8 | 6 |
| 5 | 9 | 4 | 3 | 7 | 1 | 2 | 6 | 8 |
| 7 | 8 | 2 | 9 | 6 | 4 | 5 | 1 | 3 |
| 1 | 6 | 3 | 8 | 2 | 5 | 4 | 7 | 9 |
| 9 | 1 | 7 | 2 | 3 | 6 | 8 | 5 | 4 |
| 6 | 3 | 5 | 4 | 8 | 7 | 1 | 9 | 2 |
| 2 | 4 | 8 | 5 | 1 | 9 | 6 | 3 | 7 |

**මෙවර ජයග්‍රාහකයින් නොමැත**

## තරඟ කොන්දේසි

1. ප්‍රහේලිකාව පසුපස ඇති අයදුම්පත සම්පූර්ණ කර පහත ලිපිනයට තැපැල් කළ යුතුයි.
2. මෙම තරඟයට වයිට් හැකල් සඟරාවේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට සහභාගි විය නොහැක.
3. පළමුවන, දෙවන හා තුන්වන ජයග්‍රහණ හිමිකර ගන්නා ජයග්‍රාහකයින් පිළිවෙළින් රු. 1000/, රු.750/, රු.500/ වශයෙන් මුදලින් තෑගි ලබා දීමට තීරණය කර ඇත.
4. විනිශ්චය මණ්ඩලයේ තීරණ අවසාන තීරණය ලෙස සැලකේ.
5. නිවැරදි පිළිතුරුපත් කුසපත් ඇදීමෙන් තෝරා ගනු ලබන ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා පමණක් තෑගි දීම සිදු කෙරේ.
6. පිළිතුරුපත් එවන ලියුම් කවරයේ වම් පස උඩ කෙලවරේ **"වයිට් හැකල් ප්‍රහේලිකා අංක 62"** යනුවෙන් සඳහන් කළ යුතුයි.

ලිපිනය : වයිට් හැකල් කර්තෘ,
වයිට් හැකල් ප්‍රකාශන අංශය,
රෙජි ශ්‍රීලපාහ,
යුද්ධ හමුදා ඒකාඵය,
පනාගොඩ, හෝමාගම.

## හදවත් රිදවන්න එපා

ආදරය කලාවකි
කාදමන කාලය මුලාවකි
කොපමණ පඬිවරු කිවත් අනාවැකි
ආදරය මිනි වල කපන උදැල්ලකි

සෙ/323895 ලාකෝ සදරුවන් පීවල්ටී 20 ශ්‍රීලපාහ




## වයිට්හැකල්
## ප්‍රහේලිකාව අංක 62

### කූපනය

අංකය : ..................................................

නිලය : ..................................................

නම : ..................................................

..................................................

රාජකාරි ලිපිනය : ..................................................

..................................................

..................................................

ඒකකය : ..................................................

ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................

# WAR HEROES MEMORIAL

## SRI LANKA LIGHT INFANTRY



අප සමග උරෙන් උර ගැටී සටන්බිමේ පෙරමුණ ගෙන ක්‍රියා කර ප්‍රාන දානයෙන් ඇප කැප වූ පාබල හමුදා නිලධාරීන් හා සෙබළුන් සදා අනුස්මරණය කිරීම සඳහා හිටපු යුද්ධ හමුදාධිපති රෙජිමේන්තු අධිපති ලෙසින් කටයුතු කරන අවධියේ එතුමන්ගේ සංකල්පයකට අනුව ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පරිණත සේවා අත්දැකීම් ඇති විශ්‍රාමිකයින් හා සියලුම නිලයින් දිරිමත් කිරීම්, ශ්‍රමය හා ධන පරිත්‍යාගයෙන් යුතුව ඉදි වන රණවිරු ස්මාරකයේ ඉදි කිරීම් කටයුතු සිදු වන ආකාරය දැක්වෙන රූපමය විවරණයකි.







බැලූ බැල්මට පෙනෙයි ස්මාරකය හැදෙන හැටි
ඈතට ලස්සනයි එළියක් වැටෙන හැටි
පසුබිම හැදෙනවා ගස්වල සෙවන වැටී
ස්මාරකය බබළයි එය කඳවුරට වටී

සිංහයෝ ඉන්නවා ඉදිරිය බලාගෙන
උඩ කොත දිළෙනවා විදුරු ත්‍රිකෝනෙක
සිව් කොණ හැඩයි මැද පිත්තල රටාවක
ලස්සන කරනවා ස්මාරකය අද

මියගිය රණවිරුවන් ඉන්නවා මෙය බලාගෙන
නම ගම ලියනවද අපෙ ස්මාරකය තුළ
මිය ගිය නිසා විදියක් නෑ බලනු එය
ස්මාරකය දැක සිහි කරනවද අප

පෙනෙනා කොටස පමණක් නොව මෙහි ඇත්තේ
ඇතුලත බසින විට බිම් ගෙයකුත් ඇත්තේ
සෙබළුන් මවයි පිළිරූ ඇතුළත පැත්තේ
ලස්සන කියන්නට වචනත් මට නැත්තේ

සංකල්පනාව
බනි II දිලුක බීජීඩී ආර්එස්පී
වයිටී හැකල් ප්‍රකාශන අංශය ශ්‍රීලපාහ

# පාබල හමුදා මාතාව රණින් බැබළවූ රෙපිමුබ ශ්‍රීලපාහ ක්‍රීඩකයින්

## 2015 අන්තර් රෙපිමේන්තු පැරා පිහිණුම් තරඟාවලිය

XVIII වන වරටත් පවත්වනු ලබන යුද්ධ හමුදා පැරා ක්‍රීඩා උළෙල රෙපිමේන්තු 14 ක ප්‍රධානත්වයෙන් 2015 වසරේ පවත්වන ලදී. මෙම ක්‍රීඩා උළෙල සාර්ථක කර ගැනිමට කණ්ඩායම් තරඟ සංවිධානය කිරීම සඳහා රෙපිමේන්තු වෙත ලබා දෙන ලදී. ඒ අනුව 2015 පැරා ක්‍රීඩා තරඟාවලියේ පිහිණුම් ඉසව්ව ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත සංවිධානය කිරීමට සිදු විය. 2015 ජූනි මස 17 සහ 18 යන දෙදින පුරා පැවති අතර, එහිදී රන් පදක්කම් 21 ක් ලබාගෙන ගැමුණු හේවා රෙපිමේන්තු කණ්ඩායම ශූරතාවය හිමිකර ගත් අතර, වසර පහකට පසු රන් පදක්කම් 16 ක් සමගින් එහි අනුශූරතාවය පාබල හමුදා රෙපිමේන්තු කණ්ඩායම විසින් දිනාගන්නා ලදී.



2014 වසරේ තෙවන ස්ථානය පත් වු අප බළඇණිය 2015 වසරේ ඉතා දුෂ්කරතා මධ්‍යයේ ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඩීසීජේ වාසගේ ශ්‍රීලපාහ ගේ මඟපෙන්වීම යටතේ ක්‍රීඩකයින්ගේ උනන්දුව හා කැපවීම මත අනුශූරතාවය දිනා ගැනිමට හැකි විය. 2015.06.18 දින පැරා පිහිණුම් තරඟාවලියේ සමාප්ති උළෙල යුද්ධ හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු පාසලේ පිහිණුම් තඩාකාංගනයේ දි පවත්වන ලදී. එහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා පාබල හමුදා රෙපිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඒඩීඒ කරුණාසේකර ආර්එස්පී යුඑස්පී එන්ඩීයු පීඑස්සී සහභාගි විය. මෙම තරඟාවලිය සාර්ථක කර ගැනිම සඳහා යුද්ධ හමුදා පිහිණුම් සංචිතගේ විනිසුරුවන් 14 දෙනෙකුගේ සහයෝගය ලැබිණි.

ශ්‍රීලපාහ රෙපිමේන්තුවට ආබාධිත ක්‍රීඩකයින් විසින් මෙම ජයග්‍රහනය ලබාදීම සඳහා රෙපිමුබ ශ්‍රීලපාහ අණදෙන නිලධාරි, පුහුණුකරු ජයන්ත මහතාත්, ක්‍රීඩා කණ්ඩායමේ නිලධාරි අණදෙන සහ කණ්ඩායම් සැරයන් මේජර් නොමදව සොයා බලා අධීක්ෂණය කිරීමෙන් ක්‍රීඩකයින්ගේ දක්‍ෂතා කරළියට පැමිණෙන ලදී. තරඟාවලිය සාර්ථක කර ගැනිමට සහයෝගය දුන් සියලුම දෙනාහට රෙපිමුබ ශ්‍රීලපාහ අණදෙන නිලධාරි ඇතුලු සියලුම දෙනා කෘතඥතා පූර්වකව ස්තූතිය පුද කරමු. අනුශූරතාවය දිනාගත් ක්‍රීඩකයින්ට තව තවත් ජයග්‍රහණ ලබා ජාත්‍යන්තරය ජය ගැනිමට ශක්තිය ධෛර්යය ලැබේවායි අප ඉත සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.

